


# වාර්ෂික වාර්තාව 2020

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# ஆண்டறிக்கை 2020

முகாமைத்துவ பட்டப்பின்படிப்பு நிறுவகம்

ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகம்

# Annual Report 2020

POSTGRADUATE INSTITUTE OF MANAGEMENT

University of Sri Jayewardenepura

PIM Postgraduate Institute of Management

University of Sri Jayewardenepura

# වාර්ෂික වාර්තාව 2020

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

# ஆண்டறிக்கை 2020

**முகாமைத்துவ பட்டப்பின்படிப்பு நிறுவகம்**
**ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகம்**

# Annual Report 2020

POSTGRADUATE INSTITUTE OF MANAGEMENT
University of Sri Jayewardenepura

PIM Postgraduate Institute of Management
*University of Sri Jayewardenepura*

| | |
|---|---|
| **වාර්ෂික වාර්තාව 2020** | **(01 – 62)** |
| **ஆண்டறிக்கை 2020** | **(63 – 144)** |
| Annual Report 2020 | **(145 – 217)** |

# වාර්ෂික වාර්තාව

# 2020

කළමනාකරණ පශ්චාත්උපාධි ආයතනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## PIM හි දැක්ම, මෙහෙවර හා වටිනාකම්

### දැක්ම

දකුණු ආසියාවේ කළමනාකරණ විශිෂ්ටත්ව කේන්ද්‍රයක් බවට පත්වීම

### මෙහෙවර

අපි මානව සිතුවිලි දල්වාලමින්, ලොව දිනන්නට පිය නගනා, දෙසට හිතැති නියමුවන් බිහි කරමු.

මෙම ප්‍රයත්නයේදී, අපි නව්‍ය ඉගැන්වීම් විධි, තියුණු පිරියෙසුම්, සරු-සබඳතා, පරිසර හිතෛෂී යටිතල පහසුකම් හා ආදර්ශවත් පාලනය කෙරෙහි අනුගත වෙමු.

### අපේ වටිනාකම්

**ඇල්මඃ-** වෘත්තීමය පැවැත්ම පෙරදැරිකොට ගත් උදෙයා්ගය හා උත්සුක භාවය.

මූලික ක්‍රියාකාරකම් දර්ශකය (මුක්‍රිද)

1. රැකියාව හා බැඳුණු කාර්ය භාරය පිළිබඳ පැහැදිලි බව
2. කාර්ය සාධනයෙහි-ලා දක්වන උදෙයා්ගය
3. නව විසැඳුම් සොයා ගැනීමෙහි-ලා නව්‍ය ලෙස සිතීම
4. ආයතනික සාර්ථකත්වය වෙනුවෙන් විය  යුතු දායකත්වය පිළිබඳ දැනුම්වත් බව
5. අරමුණු ළඟා කර ගැනීම වෙනුවෙන් වැඩිමනත් පරිශ්‍රමයක් දැරීමට දක්වන කැමැත්ත

**අවංක බවඃ-** ආයතනයේ යහපත සිතෙහි තබා ගෙන සද්භාවයෙන් කටයුතු කිරීම

මූලික ක්‍රියාකාරකම් දර්ශක (මුක්‍රිද)

1. සිය කටයුතු අවංක ව මෙහෙයැවීම
2. රහස්‍ය කටයුතු ඉටුකිරීමෙ දී විශ්වාසය තැබිය හැකි වීම
3. සිය චර්යාව මුළුමනින් ම ආයතනයේ නීති-රීතිවලට අනුකූල ව හැසිරවීම
4. අසාධු කටයුතු වෙනුවෙන්  පොළොඹවා ගැනීමට නොහැකි බව
5. පෞද්ගලික ප්‍රයෝජන අභිභවමින් ආයතනික අවශ්‍යතා ඉදිරියෙන් තබා ගැනීම

**අවදිමත් බවඃ-** අවබෝධයෙන් යුතු ව කටයුතු කිරීමේ දී අරමුණු හා ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය රැඳවීම

මූලික ක්‍රියාකාරකම් දර්ශක (මුක්‍රිද)

1. අදාළ තොරතුරු කෙරෙහි දක්වන සිහිමත් බව
2. අවශ්‍ය කවර මොහොතක හෝ ගත යුතු ක්‍රියාමාර්ග කෙරෙහි අවබෝධයෙන් සිටීම
3. විවෘත මනසකින් යුතු ව උද්ගත වන අවශ්‍යතා කෙරෙහි අපක්ෂපාත ව බැලීම
4. සිදු කෙරෙමින් පවතින ක්‍රියාකාරකම් කෙරෙහි පූර්ණ අවධානය රැඳවීම
5. වේලාව හසුරුවාගැනීමේ දී දක්වන කාර්යක්ෂම භාවය

පොදු ප්‍රවේශය

අපගේ විශිෂ්ටත්ව ප්‍රාසාදය




We use our Quality Management System (QMS) as a tracking mechanism of our progress

**ඉලක්ක**

**PIM හි ඉදිරි පස්-අවුරුදු කාලය සඳහා වන ඉලක්ක 5 පහතින් දැක්වේ**

**පළමුවන ඉලක්කයඃ** අධ්‍යයන පාඨමාලාවල ගුණාත්මකභාවයත් ගැළපීමත්, විෂය පථයත් වැඩි දියුණු කිරීම.

**දෙවන ඉලක්කයඃ** පර්යේෂණවල ද ප්‍රකාශනවල ද විශිෂ්ටත්වය වෙනුවෙන් කටයුතු කිරීම.

**තෙවන ඉලක්කයඃ** කර්මාන්ත, විශ්වවිද්‍යාල හා වෘත්තීය සමාජ හා සමඟ සම්බන්ධතා වර්ධනය කිරීම.

**සිව්වන ඉලක්කයඃ** අධ්‍යයන කටයුතුවලට, පර්යේෂණවලට හා උපදේශනවලට බෙහෙවින් උපකාර වන භෞතික සම්පත් වර්ධනය කිරීම

**පස්වන ඉලක්කයඃ** එක සිට හතර දක්වා වූ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකිවන සේ පරිපාලන හා මූල්‍ය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

මීට අනුකූල ව, උපායාත්මක අරමුණු 20 ක් නිර්ණය කොට ඇත.

## PIM තත්ත්ව පිළිවෙත

ආයතනය හා බැඳී පවත්නා සාරධර්මවලට පදනම් වූ විශේෂිත ආයතනික හැදියාවත්, දැනුමත්, නව්‍යකරණයත් ඔස්සේ හඹා යන, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨතම පශ්චාත්උපාධි ආයතනයක් ලෙසින්, පර්යේෂණය, සමාලෝචනය හා අඛණ්ඩ වැඩිදියුණුව හා සම්බන්ධිත ක්‍රියාවලියක් ඔස්සේ, ශික්ෂණය, පර්යේෂණය, උපදේශනය, අඛණ්ඩ අධ්‍යාපනය හා අදාළ සියලු ම මධ්‍ය හා පරිවාර ක්‍රියාවලදී, විශිෂ්ටත්වයේ විශ්වීය සම්මතයන් අනුගමනය කිරීමට කළමනාකරණ පශ්චාත්උපාධි ආයතනය සියලු කල්හි ම බැඳී සිටී.

කළමනාකරණ පශ්චාත්උපාධි ආයතනය මේ දෑ පිළිබඳ ව කැප වී සිටී.

- අපගේ ශාස්ත්‍රීය වැඩසටහන්වල තත්ත්වයත්, විෂය පථයත් වැඩිදියුණු කිරීමට,
- පර්යේෂණය හා සංවර්ධනය ඔස්සේ උපායමාර්ගික ජාත්‍යන්තර සම්බන්ධතා වැඩි දියුණු කිරීමට හා පර්යේෂණ ද ප්‍රකාශන ද විශිෂ්ටත්වයට පත්කිරීමට,
- කර්මාන්ත, විශ්වවිද්‍යාල හා වෘත්තීය සමාගම් සමඟ සහභාගිත්වය පෝෂණය කිරීමට,
- පුහුණුව ද සෙසු සහාය පහසුකම් ද ඔස්සේ පාරිභෝගිකයා කේන්ද්‍ර කරගත්, නිපුණ කාර්ය මණ්ඩලයක් ද ආචාර්ය මණ්ඩලයක් ද වර්ධනය කිරීමට,
- ආයතනයේ පරිපාලන - මූල්‍යමය ක්‍රියා පද්ධතිවල කාර්යක්ෂමතාවත්, සඵලත්වයත් වර්ධනය කිරීමට මෙන් ම,
- ස්වීය ක්‍රියාපද්ධති සමාජය හා බද්ධ වීමේ පූර්ණ අංගයක් ලෙසින්, ආයතනික සමාජ මෙහෙවර වඩවාලීමට,

## 2. අධ්‍යක්ෂකවරයා ගේ සමාලෝචනය



2020 වසර තුළ දී PIM ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ව මෙනෙහි කිරීමට මම බෙහෙවින් සතුටු වෙමි. අප ගේ පූර්ණ සාර්ථකත්වයට හේතු පාදක වූයේ ප්‍රබල හා කැපවීමෙන් ක්‍රියා කළ PIM ආයතනයේ මාගේ කාර්ය මණ්ඩලය බවට මම ප්‍රකාශ කරමි.

අප බෙහෙවින්ම දන්නා පරිදි නායකත්වය යනු පූර්ණ වශයෙන් ම උනන්දු කිරීමත්, පොළඹවාලීමත්, ප්‍රාරම්භයත් මත රැඳී පවතින්නෙකි. තව ද, මෙය තීරණ ගැනීමත්, ක්‍රියා කාරිත්වයත් මත රැඳී පවතින්නක් වන හෙයින් එය තත්ත්වය ද තනතුරු ද අභිභවා යන්නෙකි. වසර තිස් පහක් පමණ වූ කාල පරිච්ඡේදයක් තුළ අපි ජාතියට නායකයන් බිහිකරලීමේ නියැලී සිටිමු. මෙ ම පූර්ණ වෘත්තිකයෝ විශ්වාසයෙන් ද නිපුණත්වයෙන් ද යුතු ව වටිනාකම් උත්පාදනය කිරීමෙහි-ලා ප්‍රගුණත්වය ලබා ඇත්තාහ. මොවුහු රාජ්‍ය හා පෞද්ගලික යන දෙ-අංශයෙහි ම කටයුතු කිරීමට අවශ්‍ය වන තියුණු-තරගකාරී දැනුමෙන් ද, කාලීන නිපුණතාවලින් ද සමන්විත වෙති. කැපවීමත් ආවශ්‍යක බුද්ධියත් සන්නද්ධ ඔවුන් බිහි කිරීමෙහි-ලා PIM ආයතනය, ශ්‍රී ලංකාවට ඔබ්බෙන්ද සිය පියා-පත් විහිදුවමින්, සාකල්‍යයෙන් ම, විශිෂ්ටත්වයේ කේන්ද්‍රය බවට පත් ව ඇත.

විශිෂ්ඨත්වය යනු අසාමාන්‍ය ලෙස යහපත් තත්ත්වයක පැවැතීම යි. මෙ ම සංකල්පය ව්‍යාපාරවලට ඈඳා ගැනීමේ දී. යහපත් තත්ත්වය නොකඩවා පවත්වාගෙන යෑමේ අවශ්‍යතා ව පවතී. මේ අනුව ප්‍රමාණික හා ගුණාත්මක භාවය කෙරෙහි අවධානය රඳවමින් මූල්‍ය ස්වාධිනත්වයෙන් ද අර්ථ ස්වයාත්වයෙන් ද යුතු රාජ්‍ය ආයතනයක් ලෙසින් පවත්වාගෙන යාමට හැකිවීම PIM ආයතනයට ගෞරවනීය තත්ත්වයෙකි. සැබෑ හැකියාව මුදා හරිමින් හරාත්මකව කාර්ය-සාධනයෙහි නියුක්ත අතිවිශේෂ විධායකයන් බිහි කිරීම පිළිබඳ ව අපි විශිෂ්ටත්වයට පත් ව සිටිමු. බහුවිධ පැතිකඩ ඔස්සේ සමාජ-ආර්ථික ප්‍රවර්ධනය සඳහා ඔවුන් දායකත්වය සපයනු ඇත යනු ජාතියේ අපේක්ෂාව යි.

රටෙහි විශ්ව විද්‍යාල අටෙක MBA උපාධිය හා ඒ හා සමාන පශ්චාත් උපාධි පිරිනමයි. දොළහකට අධික පෞද්ගලික-විදේශීය MBA වැඩ සටහන් PIM හා සමඟ තරග කරයි. මෙ ම වැඩ සටහන්, විදේශ අරමුදල් යොදා ගනිමින් ප්‍රබල ව ප්‍රචාරණය කරන අතර MBA වැඩ සටහන් සඳහා PIM අය කරන ප්‍රමාණය මෙන් දෙගුණයකට ද වඩා ගාස්තු අය කරයි. මෙ ම තරගකාරිත්වය ඇති වනුයේ ප්‍රවේශ සුදුසුකම් පහත හෙළීමෙන් මෙන් ම, ආභ්‍යන්තරික විශ්ව විද්‍යාලයවල ඇති ප්‍රසිද්ධියට පත් සම්පත්දායකයන් යොදවා ගැනීමෙනි. මෙ ම තරගකාරිත්වය ඇති වනුයේ ප්‍රවේශ - සුදුසුකම් ගැළපීමෙන් හා ප්‍රසිද්ධ නාමයන් රැගත් දේශීය විශ්වවිද්‍යාලවල ආචාර්ය මණ්ඩලය උපයෝගී කොට ගැනීමෙනි. සවයං - උත්පාදන මූල්‍ය පදනමක් මත, ප්‍රබල ආරම්භයක් සහිත ව ක්‍රියාත්මක වන PIM ආයතනයට මෙවා ප්‍රබල අභියෝග වේ. PIM ආයතනය මුහුණ දෙන මෙ ම සීමාවන් තරගකාරී, පෞද්ගලික ආධ්‍යාපනික ආයතනවලට කවර ලෙසකින් හෝ අවහිරතා ඇති නොකරයි. ස්ව-උත්පාදන ආදායමෙන් ම සිය සියලු කටයුතු මෙහෙයවා ගැනීමේ ස්වයං-වාරණ ක්‍රියා මාර්ගය නිසා වේතන, උපයෝගිතා, සම්පාදන, ප්‍රවාහන අවශ්‍යතා, මූල-ධන වියදම්, බදු, නඩත්තු කටයුතු, ආරක්ෂක වියදම් හා විගණන ගාස්තු පියවා ගැනීම සඳහා අවශ්‍ය වන අරමුදල් උපයා ගැනීමට සිදු වේ. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනයක් නිර්භීත ව මුහුණ දෙමින්, සියලු පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් දරමින් අතිරික්තයක් ද සහිත ව ආයතනයක් කළමනාකරණය කිරීම ඇත්ත වශයෙන්ම අභියෝගාත්මක කාර්යයෙකි.

මෙ ම වර්ෂය තුළ දී, කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලයත්, අධ්‍යයන මණ්ඩලයත් විසින් PIM ආයතනය, 2020-22 ආයතනික සැලැස්ම පදනම් කර ගෙන, මනාව මෙහෙයවන ලදි. පොදුවේ ගත් කල PIM ආයතනයෙහි පස්-වැදෑරුම් ඉලක්ක, ඒ නම්:-

**පළමුවන ඉලක්කය:** අධ්‍යයන පාඨමාලාවල ගුණාත්මකභාවයත් ගැළපීමත්, විෂය පථයත් වැඩි දියුණු කිරීම.

**දෙවන ඉලක්කය:** පර්යේෂණවල ද ප්‍රකාශනවල ද විශිෂ්ටත්වය වෙනුවෙන් කටයුතු කිරීම.

**තෙවන ඉලක්කය:** කර්මාන්ත, විශ්වවිද්‍යාල හා වෘත්තීය සමාජ හා සමඟ සම්බන්ධතා වර්ධනය කිරීම.

**සිව්වන ඉලක්කය:** අධ්‍යයන කටයුතුවලට, පර්යේෂණවලට හා උපදේශනවලට බෙහෙවින් උපකාර වන භෞතික සම්පත් වර්ධනය කිරීම

**පස්වන ඉලක්කය:** එක සිට හතර දක්වා වූ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකිවන සේ පරිපාලන හා මූල්‍ය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

මනාව සාක්ෂාත් කරගත් බව සතුටින් පවසමි.

මෙහි ඊළඟ පිටු කිහිපය මිඩංගු කොට ඇත්තේ මෙ ම වර්ෂය තුළ අත්පත් කරගත් ජයග්‍රහණ පිළිඳ ව විස්තරයතක් සැපැයීමට යි.

සංවාදයට තුඩු දුන් කරුණක් වුව ද, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල අනන්‍යතාවය රැඳී ඇත්තේ ස්වාධීනත්වයත් පාලනයත් (හැසිරවීමත්) අතර පැවැත්විය යුතු මනා තුලනය මත යි. එක් අතෙකින් සවයං-මූල්‍ය, සවයං-නියාමන රාජ්‍ය ව්‍යාපාර ස්ථාපිත කිරීමට අවශ්‍ය වන අතර, අනෙක් අතින්, කාරයක්ෂමතාව, වගවීම හා සේවා විශිෂ්ටත්වය වැනි අවම සම්මත ළඟා කර ගැනීමට නිශ්චය කර ගත යුතු ය.

PIM ආයතනයෙහි ස්වීයත්වය අදාළ අණ-පනත්වල අන්තර්ගත වී ඇති අතර, පරිපාලන, මූල්‍ය හා මෙහැයවීම් පිළිබඳ ස්වාධීනත්වය ඉන් තහවුරු වී ඇත. තව ද මූල්‍යමය ප්‍රතිපාදන සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම් වැනි ප්‍රාග්ධන වියදම් සඳහා ද PIM ආයතනය මහා භාණ්ඩාගාරයෙන් නොයැපේ.

මෑත වසරවල දී, ශ්‍රී ලංකාවෙහි උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාත්මකව වැඩි වී ඇත. එහෙත්, මූල්‍ය ස්වාධීනත්වයක් සහිත හා සැලැකියයුතු ලෙසින් මහා භාණ්ඩාගාරයෙන් යැපෙන රාජ්‍ය විශ්වවිද්‍යාල වැනි ආයතන අතර බෙදීමක් සිදු කොට ඇත. පාඨමාලාවල ගුණාත්මක භාවයත් සම්පූර්ණයෙන් බැහැරවූ පාඨමාලා පැවැත්වීමේ විධිමත්බව සම්බන්ධයෙන් PIM ආයතනය හා සෙසු සංවිධාන රාශියක් අතර ව්‍යුහාත්මක ව වෙනසක් පවතී. මෙ ම වෙනසට සාමූහික හා අන්තර්-ක්‍රියාකාරී ඉගෙනීම හා ඉගෙනීමේ පහසුකම් සපයනන් යෙදී සිටීම ද, විධිමත් දේශන ද, පාරිභෝගික අවශ්‍යතා මත සැලැසුම් කරන ලද වැඩ සටහන් ද ඇතුළත් වේ. PIM ආයතනයේ කේන්ද්‍රීය අපේක්ෂාව වන්නේ රාජ්‍ය හා පෞද්ගලික අංශවල ක්‍රියාකාරීන් වෘත්තිකයන් බවට පත් කරවීම යි.

පෞද්ගලික ව්‍යාපාර සම්බන්ධයෙන් කාර්යක්ෂමතාව ප්‍රධානතම දර්ශකය නම් ලාභ උත්පාදන ය රාජ්‍ය ආයතන රැසක් උපරිමයෙන් ලාභ ඉපැයීම පදනම් කොට ගෙන බිහි කරන ලද ආයතන නොවන හෙයින් ද සහ ඒවායෙහි ක්‍රියාකාරිත්වය ලාභ ඉපැයීම මත රඳා නොපවතින හෙයින්ද මෙ වැනි ආයතනවල ලාභ ඉපැයීම ඒ මිනීමෙහි ලා ප්‍රමාණවත් දර්ශකයක් නොවේ. කෙසේ වුව ද, අපගේ මතය නම් රාජ්‍ය භාණ්ඩාගාරයට බරක් නොවී ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතන ප්‍රවර්ධනය කළ යුතු බය යි. මෙහෙයුම් ක්‍රියාකාරිත්වය හා සේවා නිකුතුව වැනි දේ දියුණු කිරීමේ අටියෙන් PIM ආයතනයේ කටයුතු වැඩි දියුනුවට උපස්තම්භක වනුයේ ක්‍රියාකාරිත්වය මත පදනම් වූ විගණනයකි.

නම්‍යතාව රඳවාගනු සඳහා විවිධ වර්ගවල ව්‍යවසාය බිහිකිරීමත්, කළමනාකරණයත්, අධීක්ෂණයත් වග බලා ගැනීමත් සඳහා අපට යම් නිර්ණායකයක් අවශ්‍ය වේ. මේ අනුව ස්වයං-මූල්‍ය උත්පාදනයක් ද, වාර්තාකරණයක් ද, පිරිස් හා යහපාලන සංවිධානයක් ද සහිත වඩා පුළුල් හා විවිධ ව්‍යවසාය පැවැතිය යුතු ය.

මූල්‍ය ස්වාධීනත්වයත් මානව සම්පත් පාලනයත් නොමැති වීමත් PIM ආයතනයේ දිගු-කාලීන සංවර්ධනයත්, වෙළෙඳපොළට අනුකූල ව හැඩගැසීමත්, කාර්යඵල වර්ධනයත් කෙරෙහි දැඩි අවහිරතා ඇති කරයි. PIM ආයතනයෙහි පූර්ණ වර්ධනය ළඟා කරගනු පිණිස PIM කළමනාකරණ මණ්ඩලය සතු ව යම් ප්‍රමාණයකට මූල්‍ය ස්වාධීනත්වයක් පවත්වාගැනීම ඉතා වැදගත් වේ.

"ජාතියේ කළමනාකරණ උපදේශක" ලෙසින් අප නිසි ලෙසින් හඳුන්වන PIM ආයතනය, එහි දැක්මත්, මෙහෙවරත්, වටිනාකමුත් අනුව අවශ්‍ය ශක්‍යතාව හා විශ්වාසය සහිත ව නායකයන් බිහිකිරීම ඔස්සේ වටිනාකම ප්‍රවර්ධනය කිරීමට තව දුරටත් කටයුතු කරනු ඇත.

**මහාචාර්ය අජන්ත ධර්මසිරි**
අධ්‍යක්ෂ

# පටුන


1. PIM දැක්ම, මෙහෙවර හා වටිනාකම් -------------------- 01
2. අධ්‍යක්ෂකවරයා ගේ සමාලෝචනය -------------------- 04
3. හැඳින්වීම -------------------- 07
4. ආයතනික සංවිධාන ව්‍යුහය -------------------- 08
5. කළමනාකරණ මණ්ඩලය -------------------- 09
6. අධ්‍යයන මණ්ඩලය -------------------- 10
7. අධ්‍යයන කටයුතු -------------------- 11
8. පර්යේෂණ -------------------- 13
9. හවුල් සම්බන්ධතා -------------------- 17
10. තිරසර බව -------------------- 19
11. යහපාලනය -------------------- 26
12. මතු සැලැසුම් -------------------- 29
13. මූල්‍ය ප්‍රකාශනය -------------------- 30
14. විගණන වාර්තාව -------------------- 53
15. විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් සපයන ලද පිළිතුරු -------------------- 61

## හැඳින්වීම

ජාතියේ කළමනාකරණ උපදේශකවරයා ලෙසින් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM), අවශ්‍ය විස්තර සහිතව, සිය 2020 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් අනතුරුව සැලසුම් කරන ලද සියලු වැඩ සටහන් නිසි කාල වකවානුවලදී සම්පූර්ණ කරමින්, බණ්ඩත්වයකින් තොරව කාර්ය සාධනය නිශ්චය කර ගනිමින්, යළි සාර්ථක ව කටයුතු යථා මාර්ගයට ගැනීමට හැකි වීම සැලකිල්ලට භාජනය කිරීම වටනේ ය.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයට අනුබද්ධ ව පිහිටවනු ලැබූ අර්ධ - ස්වාධීන ආයතනයකි. මෙහි අරමුණ වනුයේ විවිධ කළමනාකරණ හා පරිපාලන විෂය ක්ෂේත්‍රවල පශ්චාත්උපාධි උපදේශන, පුහුණු හා පර්යේෂණ ඔස්සේ ශ්‍රී ලංකාවෙහි කළමනාකරණය පිළිබඳ උසස් අධ්‍යාපනය හා වෘත්තිකත්වය ප්‍රවර්ධනය කිරීම යි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ දහස් සංඛ්‍යාත කළමනාකරුවනට හා පරිපාලකයනට, අධ්‍යාපන හා නිපුනතා වර්ධනය සඳහා, අභියෝගාත්මක අවස්ථා සපයමින්, මෙ ම ආයතනය වඩා පුළුල් පදනමක් මත, වෘත්තීය කළමනාකරණ අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ වර්තමාන ජාතික අවශ්‍යතා සපුරාලයි. ශ්‍රී ලංකාවෙහි උසස් කළමනාකරණ අධ්‍යාපනය පිළිබඳ පුරෝගාමියා ලෙසින්, කළමනාකරණ ඥානය, මෙන් ම නව්‍යකරණයෙහි හා ව්‍යාප්තියෙහි නියැලුණවුන්හට, මෙන් ම උසස් දැනුම් විකල්ප ගවේෂණය කරන්නන්හට, නායකත්වය සපයයි.

1978 විශ්වවිද්‍යාල පනත යටතේ අතුරු විධානයෙකින් 1986 හි දී පිහිටුවනු ලැබූ PIM ආයතනය, ශ්‍රී ලංකාවෙහි විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවත්නා පශ්චාත් උපාධි ආයතන හතට ඇතුළත් වන්නකි. සාපේක්ෂ වශයෙන් එ තරම් කලක් පසු කළ ආයතනයක් නොවුව ද, උක්ත ආයතන අතුරින් PIM වැඩි ම ශිෂ්‍ය-සංඛ්‍යාවක් ඇති ආයතනය වන අතර, මෙ රට විශ්වවිද්‍යාල පද්ධතියෙහි එක ම ස්වයං-මූල්‍ය උත්පාදන උසස් අධ්‍යාපන ආයතනය ද වන්නේ ය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයෙහි කළමනාකරණ අධ්‍යයන පීඨයෙහි, 1981 දී පශ්චාත් උපාධි ආයතන ඒකකය පිහිටුවීම දක්වා මෙ ම ආයතනයෙහි ආරම්භය ඇදී යයි. CIDA පදනම යටතේ කැනේඩියානු විශ්වවිද්‍යාල දෙකක් වන ඔටාවා විශ්වවිද්‍යාලයයේත්, කාල්ටන් විශ්වවිද්‍යාලයයේත් සහයෝගිත්වයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු මෙ ම ඒකකයෙන් ආරම්භ කරන ලදි.. මෙ ම ඒකකය, 1986 දී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය තුළ, ස්වාධීන ආයතනයක් ලෙසින් උසස් කරන ලදි. 1995 දී මෙ ම ආයතනය කොළඹ 08 හි වූ ලෙස්ලි රණගල මාවතේ පිහිටි අලුතින් ඉදි කරන ලද ගොඩනැගිල්ලට ගෙන යන ලදි.

# ආයතනික සංවිධාන - ව්‍යුහය

# Organizational Structure



## කළමනාකරණ මණ්ඩල

පහතින් දැක්වෙන කළමනාකරණ මණ්ඩලය ආයතනයේ අධ්‍යයන හා විධායක මණ්ඩලය වේ.

### නිල-බලයෙන් පත් කැරුණු සාමාජිකයෝ

මහාචාර්ය අජන්ත එස්. ධර්මසිරි මහතා, අධ්‍යක්ෂ සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති

මාහාචාර්ය පී.ඩී. නිමල් මහතා, පීඨාධිපති, කළමනාකරණ හා වානිජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්. පද්මලාල් මහතා, පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය

### විශ්ව විද්‍යාල කොමිෂන් සභාවෙන් පත් කරන ලද සාමාජිකයෝ

කේ.යූ.සී. දිල්රුක්ෂි මහත්මාව, අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව

අසෝක හෙට්ටිගොඩ මහතා, කළමනාකරණ අධ්‍යක්ෂ, හෙට්ටිගොඩ සමූහ ව්‍යාපාරය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලලිත් කරුණානායක මහතා, පීඨාධිපති, වෝහාර විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය

අසංග රණසිංහ මහතා, විධායක අධ්‍යක්ෂ, ඩීසල් හා මොටර් එන්ජිනියරිං PLC

දීපාල් සූරියාරච්චි මහතා, කළමනාකරණ උපදේශක

කේ.ආර්. උඩුවාවල මහතා, අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යංශය

ලලිත් වීරතුංග මහතා, අතිගරු ජනාධිපති තුමන්ගේ ප්‍රධාන උපදේශක

ලසන්ත වික්‍රමසිංහ මහතා, කොටස්කරු, BR ද සිල්වා සහ සමාගම

## අධ්‍යයන මණ්ඩලය

ඉගැන්වීම, පරීක්ෂණය හා පර්යේෂණ සම්බන්ධිත කටයුතු වසර තුළ දී හසුරුවන ලද්දේ ආයතනයේ අධ්‍යයන මණ්ඩලය විසිනි. එම මණ්ඩලය පහතින් දැක්වෙන සාමාජිකයන් ගෙන් සමන්විත විය.

### වයාපාර පරිපාලන අධ්‍යයන මණ්ඩලය

මහාචාර්ය අජන්ත එස්. ධර්මසිරි මහතා, අධ්‍යක්ෂ සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති

ආචාර්ය යූ. අනුර කුමාර මහතා, පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වානිජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය

අර්ඩ්ලි පෙරේරා මහතා, සමාගම් සභාපති / උපදේශක

ආචාර්ය ට්‍රැවිස් පෙරේරා මහතා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ උපදේශක, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

එම්. ආර්. ප්‍රෙලිස් මහතා, සමාගම් අධ්‍යක්ෂ

ආචාර්ය A. K. L ජයවර්ධන මහතා, ජ්‍යෙෂ්ඨ උපදේශක, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ආචාර්ය ට්‍රැවෝ මෙන්ඩිස් මහතා, ජ්‍යෙෂ්ඨ උපදේශක, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

### රාජ්‍ය පරිපාලනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

මහාචාර්ය අජන්ත එස්. ධර්මසිරි මහතා, අධ්‍යක්ෂක සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති

ආචාර්ය ප්‍රෙඩ්රික් අබේරත්න, උපදේශක, ප්‍රතිපත්ති ප්‍රත්‍යුත්ක්‍රම, UNDP

ආචාර්ය ලොයිඩ් ෆනැන්ඩු මහතා, වැඩසටහන් අධ්‍යක්ෂ, (රාජ්‍ය ප්‍රතිපත්ති), කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා, මහ බැංකුවේ අධිපති

W.A. විජේවර්ධන මයා, මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිව සිටි

ආචාර්ය දමිත ද සොයිසා මහතා, භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල් ව සිටි

## අධ්‍යයන කටයුතු

### පාඨමාලා සැලැසුම් හා (සැපයුම) නිකුතුව

වර්ෂය තුළ මෙහෙය වන ලද MBA පාඨමාලාවල හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවල ගුණාත්මක භාවයත් අදාළත්වයත් වැඩි දියුණු කිරීම සඳහා නව ප්‍රයත්න යොදවන ලදි. තරගකාරිත්වය අභිභවා රැඳී සිටීමේ අරමුණින්, ශිෂ්‍යයනට අධ්‍යයන කටයුතුවලදී වටිනාකමක් ලබා දෙන ගමන් ම, නැගී එන ප්‍රවනතා මෙන් ම නව දැනුම් ක්ෂේත්‍රවලට ගැළපෙන පරිදි, අධ්‍යයන-පාඨමාලා වැඩි දියුණු කෙරිණි.

### වර්ෂය තුළ පශ්චාත් උපාධි නිමැවීම

මෙ ම වර්ෂය තුළ දී, ආධ්‍යාපනික වැඩ සටහන් සාර්ථක ව ද, ලේඛනගත අයුරින් ද පවත්වන ලදි. විද්‍යාපති උපාධිය ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමා අවශ්‍යතා ද සම්පූර්ණ කරන ලද පශ්චාත් උපාධි ශිෂ්‍ය සංඛ්‍යාව අංක 01 වගුවෙන් දැක්වේ.

අංක 01 වගුව: 2020 හි පශ්චාත් උපාධි නිමකළ විද්‍යාර්ථීන්

| පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දර්ශනපති උපාධිය | 02 |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 266 |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය - විධායක | 14 |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (taxation) | 56 |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (Custom & Int.Trade) | 19 |
| රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය | 28 |
| කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 09 |
| රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 02 |
| **මුළු උපාධිධරයන් සංඛ්‍යාව** | **396** |

දත්ත මූලාශ: PIM දත්ත පදනම

### වර්ෂය තුළ ශිෂ්‍ය-බඳවා ගැනීම්

2020 වර්ෂය තුළ දී විද්‍යාපති උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් ශිෂ්‍ය-සංඛ්‍යාව 2 වැනි වගුවෙන දැක්වේ.

අංක 2 වගුව: 2020 වර්ෂය තුළදී ශිෂ්‍ය-බඳවා ගැනීම්

| පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| දර්ශනපති උපාධිය | 23 |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (කොළඹ) | 350 |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (කටාර්) | 28 |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (බහරේන්) | 13 |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය - ආදායම්බදු | 40 |
| **එකතුව** | **454** |

දත්ත මූලාශ: PIM දත්ත පදනම

### ආචාර්ය වරුන්ගේ වාර්ෂික නේවාසික වැඩමුළුව

මෙහි මූලික අරමුණ වූයේ ආයතනයේ ප්‍රධාන කාර්ය හා මෙහෙයුම්වලට අදාළ ව, කටයුතු වැඩි දියුණු කරමින්, වර්තමාන හා අනාගත අවශ්‍යතාවලට ගැළපෙන සේ ආයතනික කටයුතු වඩාත් සාර්ථකව කරගෙන යෑම සඳහා, දැනට පවතින තත්ත්වය විමර්ශනයට ලක් කිරීම යි. ඇත්ත වශයෙන් ම, මනාව සැලසුම්කරන ලද නේවාසික ආචාර්ය වැඩ මුළුවකින් විද්‍යාර්ථීන්ගේ සංසදයට නව ජීවයක් ලබා දෙන අතර, එවැනි වැඩ මුළුවෙක අන්තරගතය ඔස්සේ ආයතනයේ අනන්‍යතාව වර්ධනය කරගනිමින්, ඉදිරි ගමන සඳහා වන ආවර්ජනයකට පොදු-ප්‍රවේශයක් ලබා ගැනීමට හැකි වීම යි. රටෙහි පවත්නා තත්ත්වය මත 2020 වසරේ දී ආචාර්ය වරුන්ගේ වාර්ෂික වැඩමුළුව කල් දැමීමට සිදු විය. එහෙත්, මාසික ආචාර්ය මණ්ඩල රැස්වීම්වලදී අදාළ විෂය කරුණු සාකච්ඡාකරන ලද අතර, තීරණ ක්‍රියාත්මකකිරීමට කටයුතු කරන ලදි.

## PIM MBA විදේශීය පාඨමාලා ආරම්භය

සිය පියාපත් ශ්‍රී ලංකාවෙන් ඔබ්බට දිගු කරමින්, PIM ආයතනය සියලු කල්හි ම කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ විශිෂ්ටත්ව කේන්ද්‍රය බවට පත් ව ඇත. 2015-19 වකවානුව තුළ අත්පත් කරගත් වැදගත් ජයග්‍රහන වූයේ ආයතනයේ MBA වැඩසටහන UAE, Qatar, Oman හා Kuwait City යන කේන්ද්‍රවල සාර්ථකව ආරම්භ කිරීම යි. 2020 හි දී සිය පියාපත් තවදුරටත් විහිදුවාලමින් PIM MBA පාඨමාලාව Manama හා Baharain වලද ආරම්භ කරන ලදි. Baharain හි ඇරඹූ පාඨමාලාවට ශිෂ්‍යයෝ 13 ක් ලියාපදිංචි වූහ. නුදුරු අනාගතයේ දී, මැද පෙරදිග පොළ ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියෙහි PIM ආයතනය නියුක්ත ව සිටී.

සිය දේශිය විද්‍යාපති උපාධිය විදේශයන්හි ද ලබා ගැනීමට සලස්වමින්, අප රටට සැලකියයුතු විදේශ විනිමය උපයා ගැනීමට, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තිබෙන එක ම උසස් අධ්‍යාපන ආයතනය PIM ආයතනය වෙයි.

අධ්‍යයන කටයුතු හා සම්බන්ධ ව වර්ෂය තුළ දී අත්පත් කරගත් වැදගත් කාර්ය-සිද්ධි

1. Baharain හී දී PIM-MBA පාඨමාලාව ආරම්භ කීරීම හා එ ම පාඨමාලාවට Qatar දෙවන කණ්ඩායම බඳවා ගැනීම.
2. රටෙහි පවත්නා තත්ත්වයට අනුකූලව PIM ශිෂ්‍යයන් සඳහා මාර්ගගත සැසි හා නිවසේ සිට පිළිතුරු සැපැයීමේ පරීක්ෂණ ආරම්භ කිරීම.
3. රටෙහි පවත්නා තත්ත්වය මත (අර්ධ භෞතික හා මාර්ගගත ලෙසින්) දෙමුහුන් දේශන සැසි හඳුන්වා දීම
4. "ප්‍රඥ" අධ්‍යයන වෙබ් අඩවිය යොදා ගනිමින් මාර්ගගත හා දෙමුහුන් සැසිවල සාර්ථකත්වය තහවුරු කිරීම.
5. Turn-it-in මෘදුකාංගය යොදාගනිමින් 'අනුකරණ-සමානතා' හඳුනා ගනිමින්, අධ්‍යයන මෙහෙයුම් නිර්නායක වලට දිගින් දිගටම අනුගත වීම.

## පර්යේෂණ

ශ්‍රී ලංකාවෙහි කළමනාකරණ විෂයයෙහි පර්යේෂණ මෙතෙක් පවතිනුයේ කුළුඳුල් අවදියෙහි ය. මෙහි-ලා පවත්නා අභියෝගය නම් අපගේ පර්යේෂණ ප්‍රයත්න අනුගමනය කළ යුතු දිශාන්තය පිළිබඳ ව සුදුසු ආකෘතියක් තනා ගැනීම යි. අපට පෙනී යන පරිදි පර්යේෂණයක ප්‍රමුඛ අරමුණ විය යුත්තේ වෘත්තියක් ලෙසින් කළමනාකරණය පෝෂණය කිරීමට අවශ්‍ය වන දේශීය හර පද්ධතියක් සොයා ගැනීමයි. මෙ ම අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහිලා පර්යේෂණ පිළිගත් මට්ටම් වෙත ඔසොවා-ලීමට අවශ්‍ය වන ක්‍රම-වේද හා තර්කානුකූල ප්‍රවේශ සොයමින් සිටිමු.

2020 වර්ෂය තුළ දී, ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘති 300 කට වඩා නිම කොට ඇති අතර, ඒවා සන බැම්මෙන් බැඳ පුස්තකාලයෙන් ලබා ගැනීමට සලස්වා ඇත.

### ආචාර්ය උපාධි වැඩමුළු

පර්යේෂණ සැලැසුම්කිරීම හා සංකල්ප පත්‍රිකා ප්‍රකාශනය පිළිබඳ ව ආචාර්ය උපාධිය හදාරණ ශිෂ්‍යයන් සඳහා PIM පර්යේෂණ කේන්ද්‍රය මඟින් වැඩ මුළු මාලාවක් අරබන ලදි. මෙ ම වැඩ මුළු, ආචාර්ය නිබන්ධන සම්පූර්ණ කිරීමේ නියැලී සිටින ශිෂ්‍යයන් උනන්දු කිරීමේ අටියෙන් ගත් නව ප්‍රවේශයෙකි. මේ සඳහා ආරාධනය ලද සම්පත් දායකයන් අතර බැහැර විශ්වවිද්‍යාලවල ආචාර්යවරු මෙන්ම PIM ආචාර්ය මණ්ඩලයේ අය ද වෙති.

### සංකල්ප ප්‍රත්‍රිකා ප්‍රබන්ධ කිරීම

ශිෂ්‍යයෝ කිහිප දෙනෙකු මෙන් ම ආචාර්ය උපාධිය සඳහා ලියා පදිංචි වූ අය අතුරින් ද ගුණාත්මක බවින් යුතු විද්‍යාර්තීන් විසින් විමර්ශනය කරන ලද ලිපි ඇතුළත් ප්‍රකාශන වල පළ කිරීමට සුදුසු ලිපි සැපැයිය හැකි මට්ටමේ අය සිටිති. පූර්ව ප්‍රබන්ධ සමාලෝචනය, සෛද්ධාන්තික රාමුව, ක්‍රමවේදය, දත්ත රැස්කිරීම, දත්ත-විශ්ලේෂණය හා සාක්ෂාත් කිරීම පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමෙන් අනතුරු ආචාර්ය නිබන්ධන තහවුරුවට පාදක වන සංකල්ප ප්‍රත්‍රිකා සැසැඳීමෙහිලා ශිෂ්‍යයන් අවධානය යොමු කළ යුතු ව ඇත. ශිෂ්‍යයන් වැඩි සංඛ්‍යාවක් ආචාර්ය නිබන්දන තහවුරුව තෙක් රැගෙන යාමේ අරමුනින් මෙ ම වැඩ මුළු පැවැත්වේ.

### පර්යේෂණ සැලැසුම්

ගුණාත්මක හා සංඛ්‍යාත්මක ක්‍රම මත පදනම් වූ පර්යේෂණ සැලැසුම් පිළිබඳ ව ද මෙ ම වැඩ මුළුවල අධ්‍යයනය රුඳැවිණි. මේ සම්බන්ධයෙන් වූ විශේෂ ක්‍රම වේද සාකච්ජා කිරීම සඳහා, උක්ත වැඩමුළු වල දී කුඩා කණ්ඩායම් අතර සාකච්ජා පවත්වනු ලැබීය. සහභාගී වූවන්, පර්යේෂණ සැලැසුම් කරණයේ දී අනුගමනය කෙරෙන විවිධ ප්‍රවේශ ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරන ලද අතර, මෙ සේ ආචාර්ය උපාධියට පෙනීසිටින ශිෂ්‍යයන් ගේ ප්‍රවේශ වඩා සුමට කිරීමෙහිලා මෙ ම වැඩ මුළු දායක විය

### සම්මන්ත්‍රණ

ජාතික විද්‍යා පදනම හා එක්ව "Covid 19: Impact, Mitigation, Opportunity and Building Resiliences" මැය යටතේ PIM ආයතනය සම්මන්ත්‍රණයක් පැවැත්විය. ලොකයේ සෙසු රටවල් හා සමග පොදුවේ සලකන කල, සාර්ථකව Covid 19 කළමනාකරණය කර ගැනීමෙන් ලංකාව අත්පත් කරගත් ප්‍රතිලාභ ප්‍රශංසනීය යි. මෙ තෙක් නොවූවිරූ මහා වසංගතයෙකින් මුළු ලෝකයම කම්පාවට පත්ව පීඩා විඳිමින් තම මෙහෙවර කැපවීමෙන් යුතු ව හා විශ්ෂ්ටව අදාළ බලධරයන් විසින් ඉටු කරනු ලැබීමත් රටේ දැඩි ඒකායන හා සාර්ථක නායකත්වයත් නිසා ම ය. මෙ ම පසුබිම මත ජාතික විද්‍යා ආයතනය විසින් ඉහතින් සඳහන් ලද මාතෘකාව යටතේ දෙ-දින සම්මන්ත්‍රණයක් සැලැසුම් කරන ලදි. මෙ ම සම්මන්ත්‍රණයෙහි තේමාව වූයේ "From Adversity to Serendipity" යි. මෙ ම සම්මන්ත්‍රණයේ අරමුණ වූයේ උක්ත විෂයට සම්බන්ධ රාජ්‍ය-පෞද්ගලික අංශවලට අයත් ආයතනවලට අදාළ සියලු ම ප්‍රභල කොටස්කරුවන් එක් වහලක් යටතෙහි රැස් කරවා, මෙ ම වසංගතයේ පැතිකඩ කෙරෙහි විමර්ශනය යොමු කරවා, සවිමත් එ මෙන් ම ඔරොත්තුදෙනසුලු සමාජයක් ගොඩ නඟමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය නඟාසිටුවීම යි.

**APB (Association of Professional Bankers) සාකච්ඡා මුළුව**

ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනය පදනම් කර ගෙන, පර්යේෂණ සාකච්ඡා මුළුවක් APB හා සමඟ සැලැසුම් කිරීමට PIM පර්යේෂණ කේන්ද්‍රය කටයුතු යෙදී ය. මෙ හි අරමුණ බැංකු ක්ෂෙත්‍ර-මෙහෙයැවීම හා සම්බන්ධිත පාඨමාලාවේ අධ්‍යයන පර්යේෂණ ව්‍යපෘති ගෙන හැර දැක්වීම යි. උක්ත සාකච්ඡා මුළුව 2020 නොවැම්බර් මසට යෙදී තිබුණ ද, දැන් එය පැවැත්වෙන්නේ 2021 මාර්තු මාසයේ දී ය.

**<u>කළමනාකරණය හා සම්බන්ධිත PIM සිද්ධි -අධ්‍යයනය</u>**

මෙ රට හා විදේශීය ශිෂ්‍යයන් විසින් සපුරාලන ලද සිද්ධි-අධ්‍යයනය හා සම්බන්ධිත ව්‍යාපෘති පදනම් කරගෙන මුල් වරට නිබන්ධනය කෙරුණු සිදධි-අධ්‍යයන සංග්‍රහයේ පළමු වන වෙළුම "PIM Cases in Management" නමින් 2021 මාර්තු මාසයේ දී පළකිරීමට කටයුතු යොදන ලදි. විශේෂයෙන් පශ්චාත් උපාධිපාඨමාලාවල දැනුමත්, නිපුණතාත්, ආකල්ප වර්ධනය කිරීමට, සිදධි-අධ්‍යයන පදනම් කරගත් ඉගැන්වීම් ක්‍රමය ඉ-ප්‍රබල ක්‍රමවේදයෙකි. සිදධි අධ්‍යයනයක් යනු, ඇත්තේ සැටියට, කතාවක් වන අතර, ඉගෙනීමේ දී ප්‍රබල ව යොදා ගැනීමෙහිලා අවශ්‍ය වන සියුම්-තියුණු බුද්ධිමය කරුණු හා ඊට අනුබද්ධිත ගැටළු ඉන් කියා පායි. අන් අයුරෙකින් කිව හොත්, සිදධි-අධ්‍යයනක් යනු එක් අතෙකින් සංකේතයෙකි. නැතහොත් රූපාලංකාරයෙකි නැතහොත් උපමා-කතාවෙකි නැත හොත්, මෙ ම සිද්ධි අධ්‍යයන ආයතනවල එකිනෙකා හා ගැටෙන පුද්ගලයන් වටා ගෙතී පවතී. අන් ලෙසෙකින් පවසහොත්, කළමනාකරණයෙහි ප්‍රබලතම ස්ථම්භ වන සැලැසුම්කරණය, සංවිධානය, මෙහෙයැවීම හා සීමාකරණය පිළිබිඹු කෙරෙන තත්ත්‍ය ජීවිතයේ අනුකරණයෙකි. මනාව ගලපන ලද සිද්ධි අධ්‍යයනයත් අප බහු විධ අයුරින් පෝෂණය කරයි. ඉන් අපගේ හැකියාව හා ආත්ම විශ්වාසය වර්ධනය අයත් වන අතර අවසානයේදී, ආයතනික සාර්ථකත්වයට දායක වෙයි.

**<u>පර්යේෂණ පිළිබඳ මාසික අධ්‍යයන-කවය</u>**

2016 වර්ෂයේ දී අරඹන ලද තවත් එක් ආරම්භක ක්‍රියා මාර්ගයක් නම්, ව්‍යාපාර ද, කළමනාකරණයෙහි හා ඊට සම්බන්ධිත විෂයයන් ද පිළිබඳ ව පර්යේෂණ පවත්වන්නන් විසින් කෙරෙමින් පවත්නා පර්යේෂණ පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා වන සංසදයක් පිහිටුවීමේ අටියෙන් මාසික "සංවාදාත්මක" අධ්‍යයන-කවයක් පැවැත්වීම යි. මෙරට පුරා ම විසිරී සිටින පර්යේෂකයන් අතර අර්ථවත් හා පුෂ්ටිමත් සම්බන්ධතාවක් ගොඩනැගීම සඳහා මින් අවකාශ සැලසේ. මෙ ම වර්ෂය තුළ දී අධ්‍යයන-කව දොළසක් සාර්ථකව පවත්වන ලදි.

**ප්‍රකාශන**

විමර්ශනයට ලක් කරන ලද කාල සීමාව තුළ දී ප්‍රකාශන ක්ෂෙත්‍රයෙහි සතුටුදායක ප්‍රගතියක් දක්වන ලදි.

## (i) PIM Presentation Guideline

PIM ආචාර්ය මණ්ඩලයේ ද, ශිෂ්‍යයන්ගේ ද නිබන්ධන ලිවීම හා ඉදිරිපත් කිරීම සම-පදනමකට ගෙන ඒමට උපකාරී වන පරිදි, PIM Presentation Guidelines නමින් යුත් අත්-පොතක් සැලැසුම් කොට ප්‍රකාශනයට පත් කරවන ලදි. අනුකූලතාව දැක්විය යුතු සම්මතයට පත් නීති-රීති හා මඟ-පෙන්වීම් මීට ඇතුළත් වන අතර මෙහි අන්තර්ගතය බෙහෙවින් ම පදනම් ව ඇත්තේ Manual of American Psychological Association නැමැති සංග්‍රහයෙහි ඉදිරිපත් කරන ලද නිර්ණායක වෙයි. මෙ ම ප්‍රකාශනය සැකැසීමෙහිලා ආචාර්ය මණ්ඩලය ද දායක වූහ.

## (ii) Sri Lankan Journal of Management (SLJM)

1996හි දී අරඹන ලද මෙ ම ත්‍රෛමාසිකය ප්‍රකාශනයත්, සංවාදයත් සඳහා දිගින්-දිගට ම පදනමක් සලසා දෙයි. 2020 වසර තුළ දී අධි-ප්‍රමාණයේ වෙළුම් දෙකක් ප්‍රකාශයට පත් කරන ලදි. SLJM ප්‍රකාශනයෙහි මූලික අරමුණ නම්, කළමනාකරණය හා සම්බන්ධිත ගැටළු ආමන්ත්‍රණය කිරීමත්, අධ්‍යයන කාර්යමණ්ඩලයේ හා ශිෂ්‍යයන්ගේ අති-විශිෂ්ට පර්යේෂණවල ප්‍රතිඵල ව්‍යාප්ත කිරීමත් සඳහා සුදුසු ප්‍රකාශන මාධ්‍යයක් සපයා දීම යි. ව්‍යාපාරික ක්ෂේත්‍රයෙහි නියැළුණු අය හට ද මෙ ම ප්‍රකාශනයට සිය නිබන්ධන ඉදිරිපත් කිරීමට ඇරියුම් කෙරේ.

## (iii) The Professional Manager

SLJM ප්‍රකාශනයට අමතර ව මෙ ම අර්ධ-වාර්ෂික සඟරාව අරඹන ලද්දේ වත්මන් කළමනාකරුවන් ගේ නැඟී එන අවශ්‍යතා සපුරාලීමට යි. විශේෂිත අරමුණක් පදනම් කර නොගෙන පහසුවෙන් අවබෝධ කර ගත හැකි ශෛලියකින් කළමනාකරණය හා සම්බන්ධව අවශ්‍යයෙන් ම විශේෂ කාර්ය නැඹුරුවකින් තොරව දත යුතු කරුණු මෙ ම සඟරාවෙන් ප්‍රකාශයට පත් කෙරේ. කාලෝචිත මෙන්ම, කැළැඹුණු සංකීර්ණ පරිසරයක කටයුතු මෙහෙයවන කළමනාකරුවනට වැදගත් වන විෂය පිළිබඳව මෙ ම සඟරාවෙහි අවධානය රඳවනු ලැබේ. මෙහි කලාප දෙකක් 2020 හි දී ප්‍රකාශයට පත් කැරිණි.

**(iv)** විමර්ශනයට භාජනය කෙරෙන මෙ ම වර්ෂය තුළ දී ආචාර්ය මණ්ඩලය මෙන් ම ශිෂ්‍යයන් විසින් රචිත ලිපි 48ක් දේශීය පුවත්පත්වල පළ කැරිණි.

***අංක 3 වගුව : පර්යේෂණ, නව්‍යකරණය හා ප්‍රකාශන***

| | ප්‍රකාශනයට පත් කරන ලද | විකිණීමට තබන ලද | ඉදිරිපත් කරන ලද සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) MBA ශිෂ්‍යයන්ගේ පර්යේෂණ | -- | -- | 305 |
| (ආ) සංග්‍රහ | 02 | 02 | |
| (ඇ) සඟරා | 02 | 02 | |
| (ඈ) ග්‍රන්ථ | 01 | 01 | |
| (ඉ) පුවත්පත්හි ප්‍රකාශිත ලිපි | 62 | දෛනික පුවත්පත්හි ප්‍රකාශිත | |
| **එකතුව** | **67** | **05** | **305** |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

## EBSCO දත්ත-සමුදායෙහි SLJM සඟරාව සංග්‍රාහකත්වය ලබා ගැනීම

EBSCOHOST යනු සමපදසථයන් විසින් සමාලෝචනය කරනු ලබන සඟරා-නිබන්ධන වලට වැඩි අවධානයක් යොමු කැරුණු, ඒ මෙන් ම, මුළු මනින් නිබන්ධනවලට ම ඉඩ-හැරුණු, ප්‍රමුඛ ශාස්ත්‍රීය පර්යේෂණ ඇතුළත් වන දත්ත-සමුදායෙකි. SLJM සඟරාවේ පූර්ණ අන්තර්ගත දැන්, දත්ත-දෙකක් වන Business Source Corporate Plus සහ Business Source Ultimate ඔස්සේ ලබා ගත හැකි ය. EBSCO දත්ත-සමුදායෙහි සංග්‍රහකත්වය ලංකාවේ මුල් වරට ලබා දෙන ලද සඟරාව SLJM වෙයි. මේ අනුව, ඇත්තවශයෙන් ම, SLJM උපුටා-දැක්වීම් ප්‍රමාණය වැඩි වී ඇත.

## "දැනුම් චාරිකාව" (Knowledge voyage)

යථාවත් වූ දැනුම බෙදා ගැනීම සඳහා PIM හි ආචාර්ය මණ්ඩලය අඛණ්ඩව අධ්‍යයනයෙහි යෙදිය යුතු වෙයි. මෙ ම වර්ෂය තුළ දී ආරම්භ කරන ලද "දැනුම් චාරිකාව" අනුව, සම්පත් දායකයෙක් සිය නව සංකල්පයක්, ක්‍රියා පිළිවෙතක් හෝ යොදාගැනීමක් හෝ ආචාර්ය මණ්ඩලයේ සෙසු සාමාජිකයන් අතර බෙදා ගනී. දේශීය හා විදේශීය සම්පත් ආයතනය හා සම්බන්ධ කරගෙන (මාසික ආචාර්ය මණ්ඩලයේ රැස්වීමට පෙර පැවැත්වෙන) මෙ ම පැයක මාසික සමුළුව එන්න එන්නම වැඩි ජවයක් ලබාගෙන ඇත. මෙ ම වර්ෂය තුළ දී "දැනුම් චාරිකා" සැසි 10 ක් සාර්ථක ව පවත්වන ලදි.

**පර්යේෂණ සම්බන්ධයෙන් වර්ෂය තුළ අත්පත් කරගත් ජයග්‍රහණ**

- ප්‍රකාශන හා සම්මන්ත්‍රණවලට පර්යේෂණ නිබන්ධන ඉදිරිපත් කිරීම පිළිබඳ ව ප්‍රවර්ධනයක් ඇති වීම.
- MBA අවසාන වර්ෂයේ සිසුන් විසින් මෙහෙයවන ලද කර්මාන්ත සමීක්ෂණ පදනම් කරගෙන සැකැසූ ඒක-විෂය නිබන්ධන හඳුන්වා දීම.
- EBSCO දත්ත-සමුදායෙහි Sri Lankan Journal of Management (SLJM) සඟරාවට අනුග්‍රාහකත්වය ලැබීම.
- මාසික ව පැවැත්වෙන පර්යේෂණ සම්බන්ධිත මාසික සංවාද තව දුරටත් පවත්වා ගෙන යෑම.
- EBSCO දත්ත-සමුදායෙහි අනුග්‍රාහකත්වය ලද SLJM සඟරාවට ශ්‍රේණිගත තත්ත්වය ලබා ගැනීමට කටයුතු කිරීම.

## හවුල් සම්බන්ධතා

### ව්‍යාපාර සමඟ පවතින බැඳීම් හා උපදේශක සේවා

ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යයන මණ්ඩලය, මෙන් ම, එ වැනි බැහැරි ආයතනික සංවිධාන ඔස්සේ අධ්‍යක්ෂකවරයාගේ හා ස්ථිර ආචාර්ය මණ්ඩල සාමාජිකයන් ගේ සාමාජිකත්වය හා සහභාගිත්වය ඔස්සේ ද, PIM ආයතනය ව්‍යාපාර ව්‍යාප්තිය හා රාජය සමඟ විධිමත් සම්බන්ධකමක් පවත්වමින් පාඨමාලා හා පර්යේෂණ සම්බන්ධිතව විශේෂතා දක්වන ශිෂ්‍යයන් සඳහා සැලකිය යුතු ප්‍රධානයන් සංඛ්‍යාවක් ද වෙන් ව පවතී. මින් කිහිපයක් ප්‍රදානයන් වන අතර සමහරක් පරිත්‍යාග වේ.

ප්‍රායෝගික කළමනාකරණ ගැටළුවලට නිරාවරණය වීම ඔස්සේ, ආචාර්ය මණ්ඩලයේ අධ්‍යයන කටයුතුවල අන්තර්ගතය හා නිපුනතා වැඩි දියුණු කිරීමට හේතු වෙතැයි පෙනීයන හෙයින්, ප්‍රතිපත්තියක් ලෙසින් ආයතනය විසින්, කළමනාකරණ උපදේශන පැවරීම් භාරගනු ලැබේ. සමාගම් සැලැසුම්කරණය, ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම්, තනතුරු-විග්‍රහ හා ගෙවීම් පිළිබඳ පිළිවෙත්, පුහුණුව හා සංවර්ධන කටයුතු හා ආයතන නඟා සිටුවීම් ක්ෂේත්‍ර හා සම්බන්ධ වූ කළමනාකරණ උපදේශන සේවා කිහිපයක් ම, පසු ගිය කාලය තුළ දී, සාර්ථක ව, සම්පූර්ණ කරන ලද, කර්මාන්ත, මෙන් ම බැංකු, මූල්‍ය, රක්ෂණ, නාගරික සංවර්ධන, හා පසුගාමී සමාජ කණ්ඩායම්වල ජීවන තත්ත්වය වැඩි දියුණු කරලීමේ අරමුණු හා සම්බන්ධිත විශේෂ සේවා වැනි ක්ෂේත්‍රවල, රජයේ මෙන්ම පෞද්ගලික ආයතනවලට අයත් සේවා මීට ඇතුළත් වූහ.

## PIM UNSW හවුල

PIM-UNSW (නිව් සවුත්වේල්ස් විශ්වවිද්‍යාලය) හවුල් ගිවිසුම යටතේ ආයතනයට සැලකිය යුතු ප්‍රමාණයෙක අනුග්‍රහයක් හිමි විය.

(අ) ඒකාබද්ධ පර්යේෂණ-ව්‍යාපෘති, ආචාර්ය මණ්ඩල හුවමාරුකරගැනීම්, UNSW ආචාර්ය මණ්ඩලය PIM හි පවත්වන ලද වැඩ මුළු ඔස්සේ PIM ආචාර්ය මණ්ඩලයේ මෙන් ම දර්ශන-පති පාඨමාලා ශිෂ්‍යයන් ගේ පර්යේෂණ හා අධ්‍යයන කුසලතා වර්ධනය කර ගැනීම

(ආ) පර්යේෂණ පිළිබඳව අති විශිෂ්ට සමර්ථකම් දක්වන PIM හි MBA උපාධිධරයනට Ph.D ශිෂ්‍යත්ව ප්‍රදානය

වර්ෂය තුළ දී, මෙ ම ආයතන දෙකෙහි සහයෝගිතාව තව දුරටත් ශක්තිමත් විය.

### <u>විදේශීය විශ්වවිද්‍යාල හා සමඟ පවත්වන හවුලු-සම්බන්ධතා</u>

මෙර ට රාජ්‍ය අංශයෙහි තොරා ගන්නා ලද නිලධරයන් සමඟ, ජාත්‍යන්තර කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබා දීම සඳහා, පහතින් දක්වෙන විදේශීය විශ්ව විද්‍යාල හා සමඟ අවබෝධතා - ගිවිසුම් අත්සන් කරන ලදි.

- තායිලන්තයේ කසෙට්සාර්ට් විශ්ව විද්‍යාලයය
- නෙදර්ලන්තයේ මාස්ට්‍රිච් විශ්ව විද්‍යාලයය
- ජර්මනියේ ප්‍රැන්ක්පර්ට් විශ්ව විද්‍යාලයය
- ඉන්දුනීසියාවේ ගජමධා විශ්ව විද්‍යාලයය
- හොංකොංහි හොංකොං විශ්ව විද්‍යාලයය
- ජපානයේ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයය
- ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්ව විද්‍යාලයය

ලෝකයෙහි පවත්නා වසංගත තත්ත්වය හේතු කොට ගෙන, 2020 සඳහා සංවිධානය කරන ලද වැඩ සටහන් 2021 වර්ෂය තෙක් කල් දමන ලදි.

## පොදුරාජ්‍ය මණ්ඩලීය එලිසබත් මහරැජිණ - ශිෂ්‍යත්ව වැඩ සටහන

පොදුරාජ්‍ය මණ්ඩලයට අයත් අඩු හා මධ්‍ය ආදායම් සහිත රටවල ශිෂ්‍යයන් සඳහා දෑ-අවුරුදු විද්‍යාපති උපාධිය හැදෑරීමට, පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව (GECS) හා පොදු සහභාගීත්ව සැලැස්මේ (CSFP) අරමුදල යටතේ පොදුරාජ්‍ය මණ්ඩලීය එලිසබත් මහරැජිණ - ශිෂ්‍යත්ව වැඩ සටහන විසින් PIM ආයතනයේ MBA පාඨමාලාව පිළිගෙන ඇත.

2015 සිට, PIM හි MBA පාඨමාලාව හැදෑරීම සඳහා QECS පදනම යටතේ මේ දක්වා, පූර්ණ ගෙවීම් සහිත ශිෂ්‍යත්ව 6(හයක්) ප්‍රධානය කොට ඇත.

2020 වසරේ දී, ගැම්බියාවේ ශිෂ්‍යයකුට PIMහි MBA පාඨමාලාව හැදෑරීමට QECS විසින් ශිෂ්‍යත්වයක් පිරිනමා ඇත.

## විධායක සංවර්ධන පාඨමාලා

ව්‍යාපාරික ප්‍රජාව සමඟ හවුල් ව කටයුතු කිරීමේ අටියෙන් ආයතනවල කාර්ය මණ්ඩලය සඳහා සේවාදායකයන්-කේන්ද්‍රකොට ගෙන පුහුණු පාඨමාලා පැවැත්වීම සම්බන්ධයෙන් ද, PIM ආයතනය ඇගයීමට ලක් වෙයි. PIM ආයතනයෙන් මෙහෙයැවෙන විධායක සංවර්ධන පාඨමාලාවලින්, සංස්ථාමය පාරිභොගිකයනට දිගු කාලීන වූ ඉමහත් වටිනාකමක් ලබා දෙයි. ආයතනික ධූරාවලියෙහි විවිධ මට්ටම්වල ක්‍රියාත්මක ව සිටින විධායකයන් සඳහා අදාළ වන පුහුණු, වර්ධනයක් ඇති කිරීමෙන්, ආයතනික කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීම PIM මඟින් සිදු කෙරෙන විධායක සංවර්ධන පාඨමාලාවල අරමුණ යි. කළමනාකරණයෙහි විවිධ පැතිකඩවලින් මෙ ම පාඨමාලාවලට සහභාගිවන්නෝ සන්නද්ධ කෙරෙති. මෙ ම වර්ෂය තුළ දී ආයතනික පාරිභෝගිකයන් වෙනුවෙන් සාර්ථක ව විධායක සංවර්ධන පාඨමාලා 10 ක් පවත්වන ලදි.

වර්ෂය තුළ දී අත්පත් කර ගත් වැදගත් දෑ (හවුල් සබඳතා)

1. UNSW විශ්ව විද්‍යාලය හා සමඟ හවුල් පර්යේෂණ ව්‍යාපෘතිවල සම්බන්ධ වෙසින් PIM අධ්‍යයන කාර්ය මණ්ඩලයත් හා ආචාර්ය උපාධි ශිෂ්‍යයන් ගෙ අධ්‍යයන හා පර්යේෂණ නිපුණතා වර්ධනය කිරීම.
2. සමාගම්වල පාරිභෝගිකයන් සඳහා විධායක සංවර්ධන පාඨමාලා 10 ක් පැවැත්වීම.
3. QECS ශිෂ්‍යත්ව වැඩ සටහන යටතේ ශිෂ්‍යයනට MBA උපාධිය හැදෑරීමේ අවස්ථා ලබා දීම.
4. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ට Globus Simulation විශේෂිත වැඩ සටහනක් පවත්වා විධායක සංවර්ධන පාඨමාලාවල ගුණාත්මක හා ප්‍රමානික බව වැඩි කිරීම.
5. ඔස්ට්‍රෙලියාවේ UNSW හා ANU විශ්ව විද්‍යාල හා සමඟ ආචාර්ය උපාධි සම්බන්ධතා වර්ධනය කිරීම.

## තිරසර බව

කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ රටෙහි මුඛ්‍ය ආයතනය ලෙසින් සමස්ත රට වෙනුවෙන් සිදු කළ යුතු කැපකිරීම් හා වගකීම් පිළිබඳ ව PIM ආයතනය සඳ අවධානය රඳවා ඇත. ඒ අනුව, කළමනාකරණ ගැටළු සම්බන්ධයෙන් PIM ආයතන අනාගත ප්‍රවේශයක රැඳී සිටී. PIM හි විශිෂ්ටත්ව ප්‍රාසාදයෙහි "තිරසර බව" එක් ස්ථම්භයක් ලෙස ඇතුළත් කොට ඇත.

**තිරසර බව පිළිබඳ ස්ථම්භය ක්‍රියාවට නංවනුයේ මෙම උපායමාර්ග ඔස්සේ යි.**

(i) වර්ථමානයේහි මෙන් ම ආනාගතයේහි ද පරිසරයට හානි නොවන ලෙසින් ආයතනයේ කටයුතු පවත්වාගෙන යෑම.
(ii) ජීවිතයේ ගුණවත් බව තහවුරු කරන අතර පරිසරයත් සම්පතුත් උපරිම අයුරින් සුරක්ෂිත කෙරමින්, සත්ව-ශාක පරිසරයේ තුලනයත් පවත්වාගෙන යනු පිණිස ස්වාභාවික සම්පත් විනාශ නොවන අයුරින් පරිපාලන පද්ධතියක් නිර්මාණය කිරීම.
(iii) ශිෂ්‍යයන් ඇතුළු කොටස්කරුවන් ගේ සිත්හි තිරසර බව පිළිබඳ සංකල්පය ඇති කරවීම
(iv) MBA පාඨමාලාවලට අනුයුක්ත ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ආයතනික සමාජමය වගකීම් පදනම් වූ ව්‍යාපෘති ඔස්සේ තිරසර බව ක්‍රියාත්මක කිරීම.
(v) PIM හි 5S ක්‍රියාකාරකම් ඔස්සෙ හරිත කෘෂ (lean) පිරිසුදු වැඩ පරිසරයක් වර්ධනය කිරීම.
(vi) කඩදාසි උපයෝගීතාව වෙනුවට අභ්‍යන්තර පණිවුඩ හුවමාරුව, බඳවා ගැනීම්, අභ්‍යාස හා අවසන් ව්‍යාපෘති සඳහා විද්‍යුත් ලේඛන උපරිම ලෙසින් යොදාගනිමින් හා නොතත්-ජාල පද්ධති යොදා ගැනීම. (wireless network)

## PIM හි 5S පිළිවෙත

පහතින් දැක්වෙන අංශ, ආයතනයේ 5S පිළිවෙතහි ඉලක්ක හා අරමුණු අතර වේ.

ඉලක්ක

1. අපගේ කාර්යාල ගොඩනැගිල්ලෙහි, පරිශ්‍රයෙහි සියලු කොටස් කසලින් තොරව පිරිසුදුව හා ප්‍රසන්නව සුවතාවෙන් යුතු ව පවත්වා ගැනීම.
2. කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයන් නොකඩවා හා උද්‍යෝගයෙන් 5S ක්‍රියාවලියට සහභාගී වීම
3. ප්‍රසන්න හා සුවතාවෙන් යුතු වැඩ පරිසරයෙහි අභිමානවත් හැඟීමෙන් යුතු ව නිසි කාර්ය ඉටු කිරීම.
4. සම්පත් යොදා ගැනීම ද පරිසරය ආරක්ෂාකිරීමෙහි ද පිළිබඳ ව, ප්‍රමුඛ වැදගත්කමක් ලබා දීම.

අරමුණු

1. සියලු මට්ටම්වල කාර්යමණ්ඩලය අකර ක්‍රමිකබවක්-ශික්ෂණයත් පිළිබඳ ව, අවබෝධය වැඩි දියුණු කරවමින් ධනාත්මක ආකල්ප ඇති කිරීම.
2. සමස්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම
3. මෙහෙයුම්-සම්පත් (Operational resources) භාවිතය අවම කිරීම

4. බල-ශක්තිය අවම කරමින් පරිසරය ආරක්‍ෂා කිරීම
5. PIM පස්-විධ විශිෂ්ටත්ව කුලුනුවල අරමුණු ඉටුකර ගැනීම සඳහා ආරක්ෂිත පිරිසුදු හා මනාව සංවිධානය වුණු - යහපත් කාර්ය ස්ථානයක් බිහි කිරීම
6. කාර්යමණ්ඩල සහභාගිත්වය වර්ධනය කරමින්, සමස්ථ ආයතනය පුරා සමඟිය හා කණ්ඩායම් ලෙසින් වැඩ කිරීම නගා-ලීම
7. ආයතනික මෙහෙයුම්වල 5S ක්‍රියාකාරකම් වෙන් කළ නොහැකි කොටසක් බවට පත් කිරීම
8. යහපත් ආයතනික ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම.

## ඖෂධ උයනක් ස්ථාපිත කිරීම

වසර තුනකට පෙර මෙ ම ව්‍යාපෘතිය PIM පරිශ්‍රයෙහි ආරම්භ කරන ලද අතර, නෙනවත්වාම එය නඩත්තු කෙරෙමින් දියුණු වට පත් කරනු ලැබේ.

මෙ හි අරමුණු නම් :-

i. ඖෂධ උයන් - සංකල්පය ප්‍රචලිත කිරීම
ii. පරිසරය සමඟ හුරුවීම ප්‍රවර්ධනය කිරීම
iii. විවිධ පැලෑටි වර්ග පිළිබඳව අධ්‍යයනය හා ඒ වා හඳුන්වාදීම
iv. ආහාර පිළිවෙළ කිරීමේ දී මෙම පැලෑටි පාවිච්චිය පොළොඹවාලීම

## PIM හි ප්ලාස්ටික් වතුර බෝතල පාවිච්චියෙන් බැහැර කරවීම

මෙහි ලා පහතින් දැක්වෙන ගැටළු සැලැකිල්ලට ගන්නා ලදි.

ගැටළු අංක 01: ප්ලාස්ටික් වතුර බෝතල සෞඛ්‍යයට අහිත කරන අතර, ZDA හා Phihalato වැනි අහිතකර රසායන ද්‍රව්‍ය එහි අඩංගු වේ.

ගැටළු අංක 02: ප්ලාස්ටික් වතුර බෝතග පහසුවෙන් නොදිරන හෙයින්, ඉන් පරිසරයට සිදුවන හානිය

ගැටළු අංක 03: හරිත-නොපුළුල්-පිරිසුදු පරිසරයක් ප්‍රවර්ධනය කිරීමෙහි-ලා ප්ලාස්ටික් බෝතලවලින් එල්ලවන තර්ජනය.

PIM ආයතනයෙන් ප්ලාස්ටික් වතුර බෝතල භාවිතයෙන් ඉවත් කරලීම සඳහා වන විශේෂ ව්‍යාපෘතියක් විශේෂඥ කණ්ඩායමක ප්‍රධානත්වයෙන් දියත්කොට ඇත. මෙ ම විශේෂඥ කමිටුවේ සොයා ගැනීම හා නිර්දේශ, මෙ ම වර්ෂය තුළ ආයතනයෙහි ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් අධ්‍යයනය කරමින් සිටී.

මෙම ව්‍යාපෘතිය දියත් කිරීමෙන් අනතුරු ව, මෙම වෙනසෙන් එක එල්ලේ බලපෑමක් සිදු වන අය හට මෙන් ම සෙසු අය හට ද, ඉන් තරංගීය වෙනසක් සිදු වනු ඇත. මේ අනුව, මෙම වෙනසෙන් නිකුත් කෙරෙන පණිවුඩය පුළුල් බලපෑමකට පාදක වනු ඇත.

## කාලීනව පවත්වනු ලබන ගිනිගැනීම් හා සම්බන්ධ හදිසි අවස්ථා පිළිබඳ අභ්‍යාස

PIM හි 5S ක්‍රමවේදයේ වැදගත් අංගයක් ලෙසින් ද, කාර්ය මණ්ඩල පුහුණු හා සංවර්ධන වැඩ සටහනේ වැදගත් කොටසක් ලෙසින් ද, පරිශ්‍රයක්, ගෘහස්ථයක් ආරක්‍ෂා කිරීමේ අරමුණින් කාලීනව ගිනිගැනීම් හා සම්බන්ධ හදිසි අවස්ථාවලට මුහුණ දීමේ පුහුණු අභ්‍යාස වරින්වර පවත්වනු ලැබේ.

තවද, ගිනි නිවීමේ උපකරණ යාවත්කාලීන කරවීම ද, ආරක්‍ෂාව හා නඩත්තුව සම්බන්ධයෙන්ද වගකිව අය 5S කමිටුවෙහි නිරන්තර අවධාරණයට යොමු කොට ඇත.

## PIM ඉලක්ක

ආයතනයේ අරමුණු 5න් පහතින් දැක්වෙන ඉලක්කය උපායමාර්ගිකව තිරසර බවට සමීප සම්බන්ධතාවක් ඇති කරයි.

4 වන ඉලක්කය ඉගැන්වීමේ-ඉගෙනීමේ පරිසරයක් තැනීම සඳහා සුදුසු පරිඝණක පද්ධතිය ස්ථාපිත කිරීම හා හරිත යටිතල පහසුකම් තහවුරු කරවීම PIM ඉලක්ක ආයතනයේ අරමුණු 5න් පහතින් දැක්වෙන ඉලක්කය උපායමාර්ගිකව තිරසර බවට සමීප සම්බන්ධතාවක් ඇති කරයි.

## පරිසරය හා ආපදා බලපෑම් ඇගැයීම් විග්‍රහය

පරිසරයත් මත්තේ දී ඇති විය හැකි ආපදා පිළිබඳ ගැටළුත් PIM හි 5S ක්‍රම පද්ධතියේ දැඩි සුපරීක්‍ෂාවට ලක් කොට ඇත. නිසි නඩත්තු කටයුතුත් ආරක්‍ෂක ක්‍රමවේදත් නිසි පරිදි සිදු වන බවට මාසිකව පරීක්‍ෂණ විගණන පැවැත්වේ මෙ ම පරීක්‍ෂණ විගණන වලින් හෙළිදරවු වන විෂමතා පිළිබඳ ව, අඛණ්ඩව මසක් පාසා කළමනාකාරිත්වය මෙන් ම 5S මධ්‍ය (Core Committee) කමිටුවත් 5S පහසුකම් සපයන්නන් සමඟත් සාකච්ඡා කෙරේ. මෙ ම සාකච්ඡාවල දී සියලු ඌනතා සාකච්ඡා කොට, එම ඌනතා යථා තත්ත්වයට පත් කරවීමට ඉක්මනින් පියවර ගනු ලැබේ.

## PIM Genesis ව්‍යාපාර - උත්පාදන මැදිය

PIM හි ව්‍යාපාර උත්පාදන මැදිය, PIM Genesis කේන්ද්‍රය වෙයි. මෙ හි මූලික අරමුණ වනුයේ ශක්‍යතා සහිත ව්‍යාපාර-සංකල්ප පෝෂණය කරවිය හැකි ව්‍යාපාර බවට පත් කර-ලීම යි. මෙම ව්‍යාපාර උත්පාදන මැදිය කුසලතා සහිත ව්‍යාපාරිකයිනට, පහතින් දැක්වෙන අයුරින්, පහසුකම් සපයයි.

- සාකච්ජා පැවැත්වීම සඳහා කාර්ය-සාධන ලබා දීම
- ලබා ගත හැකි යැයි පෙනී යන මූල්‍ය-මූලාශ හා සමඟ සබධතා ඇති කරවා දීම
- ගණකාධිකාරින්-වෙළෙඳ ව්‍යාපාරිකයන්- නීතිඥයන් ආදිය ගේ සේවාවල් හා සමග සම්බන්ධතා ඇතිකරවීම
- ව්‍යාපාරික වෘත්තිකයන් හා සම්බන්ධවීමට හා අදාළ සම්බන්ධතා-ජාලවලට ප්‍රවේශ ලබා දීම
- මාර්ගෝපදේශනය හා උපදේශනය
- අදාළ පෞද්ගලික හා රාජ්‍ය ආයතන හා සමඟ සම්බන්ධතා ඇති කරවීම
- තරගකාරී උපායමාර්ග නිර්ණය කිරීම

මෙම වසර තුළ දී උක්ත අරමුණු ළඟා කර ගැනීමට PIM Genesis ක්‍රියාශීලී ලෙසින් දායක විය.

## PIM සඳහා AACSB සමාජිකත්වය ලබා ගැනීම

ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතන සංගමය (AACSB) මගින් ඊළඟ පරම්පරාවට ඔබින ප්‍රබල නායකයන් බිහිකිරීමේ අරමුණින් අධ්‍යාපනයෙන් ද, ශිෂ්‍යයන් ද, ව්‍යාපාරද සම්බන්ධ කෙරේ.

එ මෙන්ම, AACSB සංගමය එහි සාමාජිකත්වය දරණ 1600 කට වඩා අධික සංඛ්‍යාවකට හා බලයලත් ලෝක ව්‍යාප්ත විද්‍යාර්තීන් 800 කට ආසන්න සංඛ්‍යාවකට තත්ත්වය තහවුරු කරමින්. ව්‍යාපාරික තොරතුරු මෙන් ම, වෘත්තීමය-වර්ධන සේවා සැපයීමෙහි නියැලී සිටී.

2016, PIM ආයතනයට මෙ ම සංගමයේ සාමාජිකත්වය ප්‍රදානය කෙරිණි. නුදුරු අනාගතයෙහි දී AACSB සංගමයෙහි පූර්ණ බලයලත් ගෞරවනීය තත්ත්වය හිමි කර ගැනීම සඳහා PIM ආයතනය දැන් ක්‍රියා කරමින් සිටී.

## සංවර්ධනය සඳහා M5 රාමුව

ඉදිරි වර්ෂවල දී, PIM ආයතනය තව දුරටත් ඉදිරියට ගෙන යෑම සඳහා, පඤ්ච-විධ වැඩ සටහන දැනටමත් යොදා ගෙන ඇති අතර, තව දුරටත් වඩා ශක්තිමත් ව ඉදිරියට ගෙන යෑම සඳහා කටයුතු යොදන ලදි. කටයුතු සඳහා නිරන්තරයෙන් බද්ධ කර ගත් එ ම රාමුව නම්: වෙළෙඳ පොළ, සාමාජිකයන් (අධ්‍යයන හා සෙසු කාර්යමණ්ඩලය), උපදේශකවරුන්, (පුද්ගල සහාය, මාර්ගෝපදේශකත්වය හා පසු-විපරම), අධීක්ෂකයන් (එක් එක් ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා පත් කරන ලද පන්ති නියෝජිතයන්), හා MBA උපාධි සම්පූර්ණ කළ අය (PIM හි ආදි ශිෂ්‍යයන්). ආචාර්ය මණ්ඩල රැස්වීම් ද සෙසු කොටස්කරුවන් හා සමඟ පැවැත්වෙන සාකච්ඡා ද ඔස්සේ සෙසු කොටස් කරුවන්ද සහභාගීත්වය ඇති ව කටයුතු මෙහෙයැවීමට වැඩි අවධානයක් යොමු කරන ලදි.

## PIM සඳහා ISO 9001-2015 තත්ත්වය හිමිකර ගැනීම

අප ආයතනයේ යටගියාවෙහි ISO 9001-2015 සහතිකය හිමි කර ගැනීම එක් විශාල ජයග්‍රහණයක් විය. විශ්ව විද්‍යාල පද්ධතිය තුළ මේ දක්වා ම මෙ ම සහතිකය ලබාගත් එකම උසස් -අධ්‍යාපන ආයතනය PIM ආයතනය වෙයි. මෙ ම සහතිකය ලබා ගැනීම සඳහා වන ක්‍රියාවලියෙහි නියැලීම ඉතාම වාසි දායක වූයේ ඉගැන්වීම්, ඉගෙන ගැනීම් හා ඇගයීම් මෙන් ම අධ්‍යාපන, පරිපාලන හා මූල්‍ය කටයුතු පිළිබඳව වැඩි දියුණු කරගැනීම් සිදු කිරීමට හැකි වූ හෙයිනි.

## කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයනට පහසුකම්

| 70431966 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 70505660 | ලංකා බැංකුව | 2,000,000 | 4,393,305 |
| 70505677 | ලංකා බැංකුව | 2,000,000 | 4,393,305 |
| 80233140 | ලංකා බැංකුව | 25,000,000 | 25,000,000 |
| 80601267 | ලංකා බැංකුව | 17,000,000 | 17,000,000 |
| 80601341 | ජා.ඉ.බැංකුව | 15,000,000 | 15,000,000 |
| 80601361 | ලංකා බැංකුව | 15,000,000 | 15,000,000 |
| 81110575 | ලංකා බැංකුව | 35,000,000 | 35,000,000 |
| 81817205 | ලංකා බැංකුව | 35,000,000 | 35,000,000 |
| 83301982 | ලංකා බැංකුව | 30,000,000 | 30,000,000 |
| 83615260 | ලංකා බැංකුව | 45,000,000 | 50,400,000 |
| 8402199 | ලංකා බැංකුව | 15,000,000 | 15,000,000 |
| 8470918 | ලංකා බැංකුව | 12,000,000 | 12,000,000 |
| 85230220 | ලංකා බැංකුව | 20,000,000 | 20,000,000 |
| 424736 | ජා.ඉ.බැංකුව | 20,000,000 | 39,895,066 |
| 413214 | මහජන බැංකුව | 15,000,000 | 31,540,907 |
| | | | **407,062,855** |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**
**ගිණුම්කරණ සටහන් ප්‍රකාශය** රු.

| සටහන් 14. තොග | සටහන් | 2020 | 2019 |
|---|---|---|---|
| ප්‍රකාශන-මධ්‍ය ගබඩාව | | 3,136,364 | 1,840,856 |
| ප්‍රකාශන-ජාත්‍යන්තර මධ්‍යස්ථානය | | 832,912 | 832,912 |
| ලිපිද්‍රව්‍ය සහ අනෙකුත් | | 1,772,380 | 1,110,931 |
| පාඨ ග්‍රන්ථ තොගය | | 9,878,855 | 6,239,950 |
| | | 15,620,511 | 10,024,648 |

**සටහන් 15. අත්තිකාරම් සහ කලින් ගෙවීම්**

| | | | |
|---|---|---|---|
| ජාත්‍යන්තර මධ්‍යස්ථානය | | 1,641,000 | 1,641,000 |
| සකුන්තලා දුරේයිරත්නම් | | 49,364 | - |
| රවී බමුනුසිංහ | | 18,016 | 4,500 |
| ප්‍රොටෙක් සොලූෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | | 9,285 | - |
| Fire Alert | | 6,660 | - |
| International Chamber | | 7,500 | - |
| ආපිකෝ ඉන්ටීරියර් (ප්‍රයිවට්) ලිමිටඩ් | | - | 155,000 |
| පී.එස්.ඩී.සී. දයානන්ද මයා | | - | 35,975 |
| එම්.අයි.ටී. ස්ලෝන් මැනේජ්මන්ට් | | - | 4,967 |
| ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව | | - | 36,351 |
| AACSB | | - | 298,892 |
| ඒ.ජී. මෙල්කෝ එලිවේටර් | | - | 120,833 |
| එම්ටී ඉන්ටනැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් | | 17,820 | 12,960 |
| ආශා රොෂානි මිය | | - | 188,200 |
| විජිත යාපා | | 33,250 | 5,130 |
| Singer Sri Lanka | | 5,130 | 49,017 |
| AMDISA | | - | 66,164 |
| ETA Melco Engineering | | 142,800 | - |
| EBSCO International (Pvt) Ltd | | - | 2,370,405 |

**සටහන 16. ලැබිය යුතු දෑ**

| | | | |
|---|---|---|---|
| ලැබිය යුතු පාඨමාලා ගාස්තු | **16.1** | 124,621,286 | 79,305,272 |
| සේවකයන්ගෙන් ලැබිය යුතු ණය | **16.2** | 4,024,129 | 3,526,204 |
| ලැබිය යුතු පොළී | | 11,571,646 | 17,247,540 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | **16.3** | 1,370,197 | 4,719,488 |
| | | **141,587,258** | **104,798,504** |

රු.

**සටහන 16.1 ලැබිය යුතු පාඨමාලා ගාස්තු**

| | සටහන් | 2020 | 2019 |
|---|---|---|---|
| විධායක සංවර්ධන වැඩසටහන් | | 2,531,982 | 6,954,318 |
| EMBA 2018/2019 | | 850,000 | 1,037,500 |
| EMBA 2019/2020 | | 850,000 | 4,235,833 |
| MBA 2014/2015 | | 154,700 | 154,700 |
| MBA 2020/2021 | | 9,975,000 | - |
| MBA 2019/2020 | | 7,712,500 | 7,022,500 |
| MBA (CIT) 2018/2019 | | 5,687,500 | 812,500 |
| MPA 2018/2019 | | 500,000 | 750,000 |
| MBAT 2019/2020 | | 2,003,000 | 750,000 |
| PhD 2018/2019 | | 166,667 | 500,000 |
| MBA (Oman) 2019/2020 | | 10,922,461 | 5,942,625 |
| MBA (Oman) 2017/2018 | | 486,996 | 468,683 |
| MBA (Qatar) 2016/2017 | | 885,448 | 852,150 |
| MBA (Qatar) 2018/2019 | | 11,052,267 | 17,382,664 |
| MBA (Qatar) 2020/2021 | | 16,959,209 | - |
| MBA (UAE) 2019/2020 | | 20,004,682 | 8,970,000 |
| MBA (Kuwait) 2018/2019 | | 4,172,322 | 10,225,800 |
| MBA (Bangladesh) 2018/2019 | | 13,878,225 | 6,727,500 |
| | | **124,621,286** | **79,305,272** |

**සටහන් 16.2 සේවකයින්ගෙන් ලැබිය යුතු මුදල්**

| | | |
|---|---|---|
| ආපදා ණය | 3,429,747 | 2,851,189 |
| සේවක ණය | - | 666 |
| පරිගණක ණය | 135,025 | 202,000 |
| වාහන ණය | 332,557 | 388,598 |
| උත්සව අත්තිකාරම් | 100,000 | 83,750 |
| වැටුප් අත්තිකාරම් | 10,000 | - |
| අත්තිකාරම් | 16,800 | - |
| | **4,024,129** | **3,526,204** |

**සටහන 16.3 අනෙකුත් ලැබිය යුතු දෑ**

| | | |
|---|---|---|
| ජාත්‍යන්තර මධ්‍යස්ථානය | 438,000 | 438,000 |
| ලැබිය යුතු දේශන ශාලා ගාස්තු | 5,000 | 1,031,000 |
| ඉන්ධන තැම්පතු | 100,000 | 100,000 |
| තැපැල් තැම්පතු | 48,315 | 174,785 |
| ලැබිය යුතු ප්‍රකාශන | - | 182,900 |
| ආයෝජන පොළී ආදායම් මත අයකරන ලැබිය යුතු රඳවා ගැනීමේ බදු | 778,882 | 2,792,803 |
| | **1,370,197** | **4,719,488** |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**
**ගිණුම්කරණ සටහන් ප්‍රකාශය**

| සටහන 17. මුදල් සහ මුදල් හා සමාන දෑ | සටහන් | 2020 | 2019 |
|---|---|---|---|
| | | | රු. |
| ලංකා බැංකුව - බොරැල්ල ශාඛාව - ගිණුම් අංක 192596 | | (11,026,981) | 693,835 |
| සම්පත් බැංකුව (ඇ.ඩො) - බොරැල්ල ශාඛාව - ගිණුම් අංක 521830000070 | | 4,863,554 | 10,035,440 |
| ලංකා බැංකුව (නේ.වි.මු)- බොරැල්ල ශාඛාව - ගිණුම් අංක 9719360 | | 2,230,312 | 1,772,673 |
| බැංකුගිණුම - (ජාත්‍යන්තර ශාඛාව) - ගිණුම් අංක 021580683001 | | 87,461 | 87,461 |
| අරමුදල් කළමනාකරණ ගිණම - බොරැල්ල ශාඛාව 0081092993 | | 70,434,003 | 40,368,651 |
| කෙටිකාලීන ආයෝජන | 17.1 | 199,239,301 | 133,985,479 |
| | | **265,827,651** | **186,943,538** |

**සටහන 17.1 මුදල් සහ මුදල් හා සමාන දෑ**

| තැන්පතු අංකය | මූල්‍ය ආයතනය | මුහුණත වටිනාකම | 2020-12-31 දිනට තැන්පතු වේ වටිනාකම | 2019-12-31 දිනට තැන්පතු වේ වටිනාකම |
|---|---|---|---|---|
| 74147601 | ලංකා බැංකුව | 25,000,000 | 49,567,509 | 46,059,678 |
| 74811175 | ලංකා බැංකුව | 20,000,000 | 20,000,000 | 20,000,000 |
| 75405922 | ලංකා බැංකුව | 20,000,000 | 20,000,000 | 20,000,000 |
| 76869279 | ලංකා බැංකුව | 15,000,000 | 24,671,793 | 22,925,801 |
| 78439704 | ලංකා බැංකුව | 25,000,000 | 25,000,000 | 25,000,000 |
| 86833771 | ලංකා බැංකුව | 60,000,000 | 60,000,000 | - |
| | | | **199,239,301** | **133,985,479** |

| සටහන 18. ප්‍රත්‍යාගණන සංචිත | 2020 | 2019 |
|---|---|---|
| ගෘහභාණ්ඩ ප්‍රත්‍යාගණන අතිරික්තය | 4,761,623 | 4,761,623 |
| කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණන ඌණතාවය | (4,568,126) | (4,568,126) |
| ව්‍යාපාර හා ඉගෙනුම් උපකරණ | 10,424,585 | 10,424,585 |
| යන්ත්‍ර හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තය | 43,188 | 43,188 |
| | 10,661,270 | 10,661,270 |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අතිරික්තය | 146,505,169 | 146,505,169 |
| | **157,166,439** | **157,166,439** |

| සටහන 19. පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට වෙන් කිරීම් | 7,504,441 | 7,998,250 |
| එකතු - වර්ෂය සඳහා වෙන් කිරීම් | 2,668,302 | 1,851,230 |
| | 10,172,743 | 9,849,480 |
| අඩු - පාරිතෝෂික ගෙවීම් | (1,944,000) | (2,345,039) |
| **දෙසැම්බර් 31 දිනට වෙන් කිරීම** | **8,228,743** | **7,504,441** |

| සටහන 20. ශිෂ්‍යත්ව අරමුදල | | |
|---|---|---|
| ඩී.එස්. ජයසුන්දර ස්වර්ණ මුද්‍රිකා අරමුදල | 290,524 | 290,524 |
| කමලගොඩ ස්වර්ණ මුද්‍රිකා අරමුදල | 28,568 | 28,568 |
| අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල | 118,516 | 118,516 |
| | **437,608** | **437,608** |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**
**ගිණුම්කරණ සටහන් ප්‍රකාශය**

| | සටහන් | 2020 | 2019 |
|---|---|---|---|
| | | රු. | |
| **සටහන් 21. වෙන් කිරීම** | | | |
| විගණන ගාස්තු සඳහා වෙන් කිරීම | | 2,174,130 | 2,041,020 |
| උපචිත වියදම් සඳහා වෙන් කිරීම | | 1,628,500 | 5,256,860 |
| PIM ආදිශිෂ්‍ය සාමාජික ගාස්තු වෙන් කිරීම | | 5,153,673 | 2,271,120 |
| | | **8,956,303** | **9,569,000** |
| **සටහන් 22. ආපසු ගෙවිය යුතු තැන්පතු** | | | |
| ටෙන්ඩර් තැන්පතු | | 60,000 | 60,000 |
| ආරක්ෂක සේවා තැන්පතු | | 35,000 | 35,000 |
| | | **95,000** | **95,000** |
| **සටහන් 23. කලින් ලද ආදායම්** | | | |
| MBA Taxation 2020-21 | | 14,625,000 | 14,625,000 |
| MBA Taxation 2019-20 | | 940,000 | 1,959,500 |
| MBA 2020/21 | | 18,800,000 | 17,350,000 |
| MBA 2021/22 | | 20,000,000 | - |
| MBA 2019/20 | | - | 16,540,358 |
| MBA(CIT) 2018/19 | | - | 375,000 |
| PhD 2020/2023 | | 280,000 | 4,090,000 |
| MBA (UAE) 2019/20 | | - | 59,807 |
| Ambeon Holdings PLC | | - | 2,053,005 |
| | | **54,645,000** | **57,052,670** |
| **සටහන් 24.වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ** | | | |
| ජාත්‍යන්තර මධ්‍යස්ථානය | | 7,860,000 | 7,860,000 |
| උපචිත වියදම | | 12,269,119 | 18,903,161 |
| ශිෂ්‍යාධාර ගිණුම-විදේශ සිටි බැංකුව | | 1,576,639 | 2,712,364 |
| PIM ආදිශිෂ්‍ය සංගමය | | 2,117,325 | 2,117,325 |
| | | **23,823,084** | **31,592,850** |

**සටහන 4.1 5.1 6.1 7.1**

**මුළු පුනරාවර්තන වියදම - 2020 සාරාංශය**

රු.

| මාතෘකාව | සටහන 4.1 | සටහන 5.1 | සටහන 6.1 | සටහන 7.1 | එකතුව |
|---|---|---|---|---|---|
| | පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා | අධ්‍යයන සේවා | ඉගැනුම් සම්පත් | උපකාරක ක්‍රියාකාරකම් | |
| **වැටුප් සහ වේතන** | | | | | |
| 04101-4201 වැටුප් හා වේතන | 13,329,265 | 30,635,858 | 2,314,670 | 2,910,668 | 49,190,461 |
| 04102-4202 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 1,975,581 | 4,188,792 | 330,702 | 424,480 | 6,919,554 |
| 04103-4203 විශ්‍රම වැටුප් | 676,546 | 487,510 | 109,864 | 51,945 | 1,325,866 |
| 04104-4204 සේවක භාරකාර අරමුදල | 493,862 | 930,260 | 86,079 | 97,319 | 1,607,520 |
| 04105-4205 වැඩබැලීමේ දීමනාව | 12,000 | - | - | - | 12,000 |
| 4107 පර්යේෂණ දීමනාව | 288,536 | - | - | - | 288,536 |
| 04108 අධ්‍යයන දීමනා | - | 3,547,714 | - | - | 3,547,714 |
| 04208 අතිකාල දීමනා | 2,396,458 | - | 169,822 | 239,751 | 2,806,031 |
| 04110-4210 අනෙකුත් දීමනා | 6,276,477 | 1,014,751 | 482,892 | 797,834 | 8,571,953 |
| 04111 බාහිර කථිකාචාර්ය ගාස්තු | - | 9,157,014 | - | - | 9,157,014 |
| 04112-4212 පාරිතෝෂිකය | 551,558 | 650,649 | 46,732 | 1,419,363 | 2,668,302 |
| 04213 ජීවන වියදම් දීමනාව | 1,333,800 | 156,000 | 187,200 | 96,619 | 1,773,619 |
| | 27,334,084 | 50,768,547 | 3,727,960 | 6,037,979 | 87,868,571 |
| **ගමන් වියදම් හා යැපීම්** | | | | | |
| 0501 දේශීය | 2,222,084 | 2,241,546 | 209,000 | 302,525 | 4,975,155 |
| 0502 විදේශීය | 137,136 | - | - | - | 137,136 |
| | 2,359,220 | 2,241,546 | 209,000 | 302,525 | 5,112,291 |
| | | | | | |
| **සැපයුම්කරුවන්** | | | | | |
| 0601 ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 638,846 | - | 7,380,853 | - | 8,019,699 |
| 0602 ඉන්ධන සහ ලිහිසි තෙල් | 119,182 | - | - | - | 119,182 |
| 0603 නිළ ඇඳුම් සහ මැසීමේ ගාස්තු | 200,650 | - | - | - | 200,650 |
| 0604 කාර්මික සහ විද්‍යුත් භාණ්ඩ | 142,900 | 7,700 | - | - | 150,600 |
| 0607 අනෙකුත් සැපයුම්කරුවන් | 1,216,578 | 167,670 | - | 13,500 | 1,397,748 |
| | 2,318,156 | 175,370 | 7,380,853 | 13,500 | 9,887,879 |

| මාතෘකාව | පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා | අධ්‍යයන සේවා | ඉගැනුම් සම්පත් | උපකාරක ක්‍රියාකාරකම් | එකතුව |
|---|---|---|---|---|---|
| **අළුත්වැඩියා** | | | | | |
| 0701 රථවාහන | 383,375 | - | - | - | 383,375 |
| 0702 දේපල, පිරියත සහ උපකරණ | 261,607 | - | - | 8,175 | 269,782 |
| 0703 ගොඩනැගිලි සහ ව්‍යුහය | 1,174,473 | - | - | - | 1,174,473 |
| 0704 දූව භාණ්ඩ | - | - | - | - | - |
| 0705 අනෙකුත් | 1,363,930 | - | - | 1,173,326 | 2,537,256 |
| | 3,183,385 | - | - | 1,181,501 | 4,364,886 |
| **ගිවිසුම්ගත සේවාවන්** | | | | | |
| 0802 සංනිවේදනය | 2,910,863 | 170,609 | - | 27,976 | 3,109,448 |
| 0803 තැපැල් ගාස්තු | 198,546 | - | - | - | 198,546 |
| 0804 විදුලි ගාස්තු | 5,533,000 | - | - | - | 5,533,000 |
| 0805 ආරක්ෂක සේවා | 2,872,319 | - | - | - | 2,872,319 |
| 0806 ජල ගාස්තු | 445,601 | - | - | - | 445,601 |
| 0807 සනීපාරක්ෂක සේවා | 4,758,792 | - | - | - | 4,758,792 |
| 0808 කුලී ගාස්තු | - | - | - | - | - |
| 0809 බදු ගෙවීම් | 652,390 | - | - | - | 652,390 |
| 0810 මුද්‍රණ හා ප්‍රචාරන වියදම් | 1,405,298 | 1,487,349 | - | 183,268 | 3,075,915 |
| 0811 අනෙකුත් | 124,578 | - | - | - | 124,578 |
| | 18,901,386 | 1,657,958 | - | 211,244 | 20,770,589 |
| **අනෙකුත් පුනරාවර්තන වියදම්** | | | | | |
| 0902 විශේෂ සේවා - සභාව හා කමිටු | 1,055,640 | - | - | - | 1,055,640 |
| 0903 විශේෂ සේවා - වෘත්තිකයින් | 133,955 | 1,735,887 | - | - | 1,869,842 |
| 0904 වැඩ මුළු | 7,363 | 48,224 | - | - | 55,587 |
| 0905 අධ්‍යයන දීමනා | - | 825,460 | - | - | 825,460 |
| 0906 සේවක ප්‍රවර්ධන | 44,555 | 273,170 | - | - | 317,725 |
| 0907 අනෙකුත් සංවිධාන සඳහා ප්‍රධාන | 5,000,000 | - | - | - | 5,000,000 |
| 0908 නිවාඩු හා වාරප්‍රවේශපත් | 65,430 | - | - | - | 65,430 |
| 0909 විනෝදාශ්වාද වියදම් | 934,840 | 352,295 | - | - | 1,287,135 |
| 0910 බැංකු ගාස්තු | 1,481,406 | - | - | - | 1,481,406 |
| 0912 දායකත්ව සහ සාමාජික ගාස්තු | - | 2,219,556 | 2,609,429 | - | 4,828,985 |
| 0913 උපාධි ප්‍රදානෝත්සව | - | | - | - | - |
| 0914 විභාග වියදම් | 476,020 | 9,575,435 | - | - | 10,051,455 |
| 0915 අනෙකුත් - පත්තර, සඟරා | 1,171,800 | 335,925 | - | 352,405 | 1,860,129 |
| 0916 සුභසාධක සමිතිය | 2,674,103 | - | - | - | 2,674,103 |
| | 13,045,112 | 15,365,952 | 2,609,429 | 352,405 | 31,372,897 |

සටහන 4.1 5.1 6.1 7.1
මුළු පුනරාවර්තන වියදම - 2020 සාරාංශය

රු.

| මාතෘකාව | සටහන 4.1 | සටහන 5.1 | සටහන 6.1 | සටහන 7.1 | එකතුව |
|---|---|---|---|---|---|
| | පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා | අධ්‍යයන සේවා | ඉගැනුම් සම්පත් | උපකාරක ක්‍රියාකාරකම් | |
| MBA ( UAE) 2019/2020 | - | 1,750,245 | - | - | 1,750,245 |
| MBA ( Qatar) 2018/2019 | - | 3,597,340 | - | - | 3,597,340 |
| MBA ( Qatar) 2020/2021 | - | 642,098 | - | - | 642,098 |
| MBA (Oman)2017/2018 | - | 71,460 | - | - | 71,460 |
| MBA (Oman)2019/2020 | - | 2,087,248 | - | - | 2,087,248 |
| MBA (Kuwait) 2018/2019 | - | 227,731 | - | - | 227,731 |
| MBA (Bangladesh) 2018/2019 | - | 1,345,765 | - | - | 1,345,765 |
| MBA (Bahrain) 2019/2021 | - | 771,314 | - | - | 771,314 |
| | **-** | **10,493,200** | **-** | **-** | **10,493,200** |
| මුළු එකතුව | **67,141,343** | **80,702,573** | **13,927,242** | **8,099,154** | **169,870,312** |

සටහන 4.1 5.1 6.1 7.1

මුළු පුනරාවර්තන වියදම - 2019 සාරාංශය රු.

| මාතෘකාව | සටහන 4.1<br>පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා | සටහන 5.1<br>අධ්‍යයන සේවා | සටහන 6.1<br>ඉගැනුම් සම්පත් | සටහන 7.1<br>උපකාරක ක්‍රියාකාරකම් | එකතුව |
|---|---|---|---|---|---|
| **වැටුප් සහ වේතන** | | | | | |
| 04101-4201 වැටුප් හා වේතන | 12,622,973 | 32,850,343 | 2,503,105 | 3,106,734 | 51,083,155 |
| 04102-4202 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 1,903,874 | 3,967,143 | 389,740 | 475,963 | 6,736,719 |
| 04103-4203 විශ්‍රම වැටුප් | 583,242 | 293,249 | 103,909 | 43,367 | 1,023,766 |
| 04104-4204 සේවක භාරකාර අරමුදල | 497,423 | 852,078 | 89,327 | 113,268 | 1,552,097 |
| 04105-4205 වැඩබැලීමේ දීමනාව | 251,733 | 79,514 | - | - | 331,247 |
| 4107 පර්යේෂණ දීමනාව | - | 2,208,228 | - | - | 2,208,228 |
| 04108 අධ්‍යයන දීමනා | 5,122,478 | - | 700,017 | 953,142 | 6,775,637 |
| 04208 අතිකාල දීමනා | 5,579,314 | 897,941 | 615,091 | 1,093,069 | 8,185,416 |
| 04110-4210 අනෙකුත් දීමනා | - | 14,895,092 | - | - | 14,895,092 |
| 04111 බාහිර කථිකාචාර්ය ගාස්තු | 1,035,943 | 369,666 | 310,796 | 134,850 | 1,851,255 |
| 04112-4212 පාරිතෝෂිකය | 1,248,000 | 93,600 | 187,200 | 187,200 | 1,716,000 |
| 04213 ජීවන වියදම් දීමනාව | 28,844,980 | 56,506,855 | 4,899,185 | 6,107,593 | 96,358,613 |
| | | | | | |
| **ගමන් වියදම් හා යැපීම්** | 2,451,296 | 2,743,434 | 223,900 | 301,939 | 5,720,569 |
| 0501 දේශීය | 183,501 | 468,316 | 17,350 | 25,300 | 694,467 |
| 0502 විදේශීය | 2,634,797 | 3,211,750 | 241,250 | 327,239 | 6,415,036 |
| | | | | | |
| | | | | | |
| **සැපයුම්කරුවන්** | 3,667,851 | 25,605 | 10,891,950 | - | 14,585,406 |
| 0601 ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 385,278 | - | - | - | 385,278 |
| 0602 ඉන්ධන සහ ලිහිසි තෙල් | 447,112 | - | - | - | 447,112 |
| 0603 නිළ ඇඳුම් සහ මැසීමේ ගාස්තු | 164,906 | 258,700 | - | - | 423,606 |
| 0604 කාර්මික සහ විද්‍යුත් භාණ්ඩ | 2,672,469 | 58,767 | 675,000 | 1,567,840 | 4,974,076 |
| 0607 අනෙකුත් සැපයුම්කරුවන් | 7,337,616 | 343,072 | 11,566,950 | 1,567,840 | 20,815,478 |

| මාතෘකාව | පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා | අධ්‍යයන සේවා | ඉගැනුම් සම්පත් | උපකාරක ක්‍රියාකාරකම් | එකතුව |
|---|---|---|---|---|---|
| **අළුත්වැඩියා** | | | | | |
| 0701 රථවාහන | 1,543,977 | - | - | - | 1,543,977 |
| 0702 දේපල, පිරියත සහ උපකරණ | 589,676 | - | - | - | 589,676 |
| 0703 ගොඩනැගිලි සහ ව්‍යුහය | 3,804,131 | - | - | - | 3,804,131 |
| 0704 දුව භාණ්ඩ | - | - | - | - | - |
| 0705 අනෙකුත් | 2,699,312 | 183,966 | - | 811,102 | 3,694,380 |
| | 8,637,095 | 183,966 | - | 811,102 | 9,632,163 |
| **ගිවිසුම්ගත සේවාවන්** | | | | | |
| 0802 සංනිවේදනය | 4,608,429 | 117,582 | - | 445,311 | 5,171,322 |
| 0803 තැපැල් ගාස්තු | 47,673 | - | - | - | 47,673 |
| 0804 විදුලි ගාස්තු | 8,985,494 | - | - | - | 8,985,494 |
| 0805 ආරක්ෂක සේවා | 3,316,323 | - | - | - | 3,316,323 |
| 0806 ජල ගාස්තු | 836,659 | - | - | - | 836,659 |
| 0807 සනීපාරක්ෂක සේවා | 5,694,079 | - | - | - | 5,694,079 |
| 0808 කුලී ගාස්තු | - | - | - | - | - |
| 0809 බදු ගෙවීම් | 9,000,103 | - | - | - | 9,000,103 |
| 0810 මුද්‍රණ හා ප්‍රචාරන වියදම් | 3,953,528 | 13,878 | - | - | 3,967,406 |
| 0811 අනෙකුත් | 109,913 | - | 56,123 | - | 166,035 |
| | 36,552,201 | 131,460 | 56,123 | 445,311 | 37,185,095 |
| **අනෙකුත් පුනරාවර්තන වියදම්** | | | | | |
| 0902 විශේෂ සේවා - සභාව හා කමිටු | 746,419 | - | - | - | 746,419 |
| 0903 විශේෂ සේවා - වෘත්තිකයින් | 150,218 | 107,570 | - | - | 257,788 |
| 0904 වැඩ මුළු | - | 21,350,667 | 6,500 | - | 21,357,167 |
| 0905 අධ්‍යයන දීමනා | - | 4,882,485 | - | - | 4,882,485 |
| 0906 සේවක ප්‍රවර්ධන | 6,395,884 | 1,203,816 | 25,000 | - | 7,624,700 |
| 0907 අනෙකුත් සංවිධාන සඳහා ප්‍රධාන | 98,475 | - | - | - | 98,475 |
| 0908 නිවාඩු හා වාරප්‍රවේශපත් | 87,660 | - | - | - | 87,660 |
| 0909 විනෝදාස්වාද වියදම් | 541,475 | 1,416,372 | - | - | 1,957,847 |
| 0910 බැංකු ගාස්තු | 1,814,894 | - | - | - | 1,814,894 |
| 0912 දායකත්ව සහ සාමාජික ගාස්තු | 138,732 | 339,713 | 908,289 | 43,134 | 1,429,867 |
| 0913 උපාධි ප්‍රදානෝත්සව | 63,660 | 8,266,932 | - | - | 8,330,592 |
| 0914 විභාග වියදම් | 1,216,801 | 7,362,602 | - | - | 8,579,402 |
| 0915 අනෙකුත් - පත්තර, සඟරා | 4,283,446 | 365,696 | 29,350 | 441,573 | 5,120,065 |
| 0916 සුභසාධක සමිතිය | 6,914,405 | - | - | - | 6,914,405 |
| | 22,452,067 | 45,295,853 | 969,139 | 484,707 | 69,201,767 |

සටහන 4.1 5.1 6.1 7.1

මුළු පුනරාවර්තන වියදම - 2019 සාරාංශය

රු.

| මාතෘකාව | සටහන 4.1<br>පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා | සටහන 5.1<br>අධ්‍යයන සේවා | සටහන 6.1<br>ඉගැනුම් සම්පත් | සටහන 7.1<br>උපකාරක ක්‍රියාකාරකම් | එකතුව |
|---|---|---|---|---|---|
| MBA ( UAE) 2017/2018 | - | 6,573,549 | - | - | 6,573,549 |
| MBA ( UAE) 2019/2020 | - | 11,858,081 | - | - | 11,858,081 |
| MBA ( Qatar) 2018/2019 | - | 12,514,032 | - | - | 12,514,032 |
| MBA ( Qatar) 2020/2021 | - | 8,230,459 | - | - | 8,230,459 |
| MBA (Oman)2017/2018 | - | 8,614,597 | - | - | 8,614,597 |
| MBA (Oman)2019/2020 | - | 9,585,190 | - | - | 9,585,190 |
| MBA (Kuwait) 2018/2019 | - | 10,676,651 | - | - | 10,676,651 |
| MBA (Bangladesh) 2018/2019 | - | 490,599 | - | - | 490,599 |
| MBA (Bahrain) 2019/2021 | **-** | **68,543,158** | **-** | **-** | **68,543,158** |
| මුළු එකතුව | **106,458,757** | **174,216,114** | **17,732,647** | **9,743,792** | **308,151,310** |

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඩී/පීඅයිඑම්/එෆ්ජ්/20/5 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 ජූලි 28 දින

අධ්‍යක්ෂ,

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් : 01. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

02. ලේකම් - මුදල් අමාත්‍යාංශය

03. උපකුලපති - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

04. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එච්ඊඩී/ඩී/පීඅයිඑම්/එෆ්ජ්/20/5 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2021 ජූලි 28 දින |

අධ්‍යක්ෂ,

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 76 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ දිනෙන් පසුව මාස 12 ක් තුළ උපලබ්ධි වෙතැයි අපේක්ෂිත වත්කම් හැර අනෙකුත් වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 212,231,785 ක් වූ ස්ථාවර තැන්පතු 33 ක් වර්ෂ 03 කට අධික කාලයක සිට වාර්ෂිකව නැවත ආයෝජනය කර තිබුණද එම තැන්පතු ජංගම නොවන වත්කම් යටතේ දැක්වීම වෙනුවට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ට පටහැනිව සේවක ප්‍රතිලාභ ගණනය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී විශ්‍රාම ගිය නිලධාරියෙකුට පාරිතෝෂික සඳහා ප්‍රතිපාදිත මුදල ඉක්මවා රු. 1,329,592 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) ආයතනයේ කාර්යාල උපකරණ 2018 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කිරීමේ දී එම වත්කම්වල ඇති වී තිබුණු හානිකරණ අගය වියදමක් ලෙස ආදායමට ලියාහැරීමට කටයුතු නොකර අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තයට ගලපා තිබුණි. මෙම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ප්‍රත්‍යාගණන සංචිතය රු. 4,568,126 ක් අඩුවෙන් දැක්වුණි.

(ඈ) 2019 වර්ෂය තුලදී මිලදී ගන්නා ලද එකතුව රු.722,373 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත නොකිරීමේ දෝෂය සමාලෝචිත වර්ෂය තුලදී නිවැරදි කිරීමේදී පොදු සංචිත ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීමේ දී කාර්යාල සවිකිරීම් හා උපකරණ සහ මෝටර් වාහන වල පිරිවැය ඉක්මවා රු. 359,537 කින් ක්ෂය කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිළි කිරීමේ මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සමඟ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කළමනාකරණ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | විස්තරය |
|---|---|
| 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 89 වගන්තිය | විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අවුරුදු 65 සම්පූර්ණ වූ අයද විශ්‍රාම ගැනීමේ වයසට එළඹ ඇති බවට සලකා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ දායකත්වයෙන් ඉවත් කළ යුතු වුවද වයස 65 ඉක්මවූ කළමනාකරණ උපදේශකවරුන් 03 දෙනෙකු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවකු වෙනුවෙන් ආයතනය විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සේව්‍ය දායක මුදල්ද ඇතුළුව සියයට 15 බැගින් දායක මුදල් ගෙවමින් පැවතුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනය බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) වසර 3 කට අධික කාලයක සිට පාඨමාලා 3 කට අදාලව පැවත එන එකතුව රු.1,527,144 ක් වූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ලැබිය යුතු පාඨමාලා ගාස්තුවලින් රු. 10,291,322 ක් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව ආදායමට එරෙහිව කපා හැර තිබුණි.

(ඇ) ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති (MBA) හා දර්ශනපති (PhD) උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වන සිසුන්ගෙන් නියමිත කාලය තුළ MBA උපාධිය සම්පූර්ණ නොකළ සංඛ්‍යාව සියයට 10 සිට සියයට 22 දක්වාද, PhD උපාධිය සියයට 80 සිට සියයට 95 දක්වාද වූ පරාසයක පැවතුණි.

(ඈ) ආයතනයේ අනුමත අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 44 ක් වූ අතර ස්ථිර කාර්ය මණ්ඩලය ලෙස 30 දෙනෙකු පමණක් බඳවා ගෙන ඇත. පුරප්පාඩු වූ තනතුරු සඳහා නිලධාරීන් 08 දෙනෙකු වසර ගණනාවක සිට කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.

(ඉ) ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා ක්‍රමයක් සහ විධායක සංවර්ධන වැඩමුළු පැවැත්වීමෙන් ලැබෙන අතිරික්ත මුදල් මඟින් ප්‍රතිලාභ සැලසෙන ක්‍රමවේදයක් ක්‍රියාත්මක වෙමින් තිබියදී සුභසාධක සංගමයේ අරමුදලින් ආහාර දීමනා හා තෑගි වවුචර් ලබා දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු. 3,223,883 ක් වැය කර තිබුණි.

(ඊ) ආයතනයේ ආපනශාලාව කොන්ත්‍රාත් පදනම මත බඳු දී තිබියදී කළමනාකරණ මණ්ඩලයේ තීරණයක් මත කොවිඩ් 19 වසංගත තත්ත්වය පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේ මැයි සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් ආපන ශාලාවේ සේවකයන් දෙදෙනෙකුට රු.825,000 ක් ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

## විගණන නිරීක්ෂණ සඳහා ආයතනයේ අදහස් දැක්වීම් හා පැහැදිලි කිරීම්

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) අදාළ ස්ථාවර තැන්පතු මාස 12 ක් තුළ පරිණත වන අතර ඒවා මුදල් බවට පත්කරන්නේ ද නැතහොත් නැවත ආයෝජනය කරන්නේ ද යන්න තීරණය කරනුයේ ආයතනයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතා සැළකිල්ලට ගෙනය. ආයතනයේ නව ගොඩනැගිල්ල ඉදිවෙමින් පවත්නා අතර ඒ සඳහා මුළුමනින්ම අරමුදල් සපයාගනුයේ ස්ථාවර තැන්පතු උපලබ්ධි කිරීමෙනි. එසේම තැන්පතු පරිණත වන විට එම මුදල් ආයතනයේ වෙනත් මෙහෙයුම් අවශ්‍යතා වෙනුවෙන් ද ප්‍රයෝජනයට ගැනේ. මාස 12 කින් පරිණත වන ස්ථාවර තැන්පතු ජංගම වත්කම් යටතේ වර්ග කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (76) ට අනුකූලව සිදුකොට ඇති බව ආයතනයේ විශ්වාසය වේ.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (LKAS-19) සඳහන් සමීකරණ ක්‍රමය පදනම් කොට ගෙන විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනයන් සිදුකර ඇත. එම ක්‍රමය භාවිතයට ගෙන ඇත්තේ 2012 වර්ෂයේ සිටයි. ඌණ ප්‍රතිපාදනයන් අනාවරණය වන බැවින් 2012 වර්ෂයේ සිට සිදුකරන ලද ප්‍රතිපාදනයන් නැවත පරීක්ෂා කිරීමට පියවර ගනු ලැබේ. එම පරීක්ෂාවෙන් පසු පාරිතෝෂික ගෙවීම් පනත අනුව ප්‍රතිපාදනයන් සිදුකරීමට හෝ වෙනත් විකල්ප ක්‍රමයක් භාවිතයට ගැනීමට ක්‍රියාකරනු ලැබේ.

(ඇ) වත්කම් ප්‍රත්‍යාගණනය හානිකරණ අගය ප්‍රත්‍යගණන සංචිතයෙන් ඉවත් කර පොදු සංචිතයට ගැලපීමට ඉදිරි මූල්‍ය වර්ෂයේදී පියවර ගනු ලැබේ.

(ඈ) මෙම දෝෂය 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව හඳුනාගත් ගිණුම්කරණ දෝෂයකි. ආයතනයේ සමස්ත අයභාරය හා ශුද්ධ වත්කම්වලට සාපේක්ෂව මෙම දෝෂය ප්‍රමාණාත්මක නොවන බැවින් පූර්ව වර්ෂයට ගලපා පූර්ව වර්ෂයේ මූල්‍ය වාර්තා නැවත ප්‍රකාශ කිරීමකින් (Restate) තොරව ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කොට ඇත.

(ඉ) මෙම ගිණුම්කරණ දෝෂය ඉදිරි මූල්‍ය වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

### 2.2.2 නීති රීති විධානයට යොමුව

අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ අය හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වයස අවුරුදු 65 සම්පූර්ණ වූ අය සේවා අවශ්‍යතාවය පදනම් කොටගෙන පැවරුම් පදනම් මත සේවා නියුක්ත ඇති නමුත් 2021 ජනවාරි 01 දින සිට ඔවුන් සඳහා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම සිදු කරනු නොලැබේ.

### 2.3 වෙනත් කරුණු

(අ) මේ පිළිබඳව වරින් වර සිසුන්වෙත දැනුවත් කිරීම් සිදු කළ ද ගෙවීම් සිදුකිරීමට පියවර ගෙන නොමැත. අදාළ සිසුන් වෙත සහතික පත්‍ර නිකුත් කරනුයේ සියලු හිඟ මුදල් අයකර ගැනීමෙන පසුව පමණි. නියමිත ගාස්තු ගෙවා නොමැති සිසුන්ට අදාළ පරීක්ෂණවලට පෙනී සිටීමට අවසර ලබා නොදීමට ඉදිරියේ දී පියවර ගනු ලැබේ.

(ආ) අදාළ පශ්චාත් උපාධි පාඨමාලා කාලය වර්ෂ දෙකක් වන බැවින් එම කාල සීමාව අවසානයේ හිඟ පාඨමාලා ගාස්තු ලියාහැරීම සිදුකරනු ලැබේ. ප්‍රවර්තන වර්ෂයේ මෙම ලියාහැරීම සිදුකරන ලද්දේ කළමනාකරණ මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්වයි. කළමනාකරණ මණ්ඩලය

විසින් ගිණුම් වාර්තා අනුමත කරන විට මෙම ලියාහැරීම සම්බන්ධයෙන් ද අවධානය යොමුකරන ලදී.

කෙසේ වුවද මේ සම්බන්ධයෙන් වෙනම ම මෙමෝ පත්‍රිකාවක් මීලඟ කළමනාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කොට ආවරණ අනුමැතිය ලබාගැනීමට පියවර ගනු ලැබේ.

(ඈ) ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලාවන්හි ගුණාත්මකභාවය පවත්වාගෙන යාම කෙරෙහි විශේෂ අවධානයක් ආයතනය විසින් යොමුකරන නිසා ඇතැම් සිසුන් නියමිත ප්‍රමිති මට්ටමට ලඟාවීමට අපහසු වීම හෝ වෙනත් පෞද්ගලික හේතුන් මත නියමිත කාලය තුළ පාඨමාලා සම්පූර්ණ කළ නොහැකි තත්ත්වයක සිටිය හැක.

(ඇ) කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවාගෙන ඇත්තේ ආයතන නියමාවලිය මගින් ලබා දී ඇති බලතල ප්‍රකාරව කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මතයි. සේවා අවශ්‍යතාවය පදනම් කොටගෙන ආයතනයට වඩාත් සුදුසු සේවකයින් බඳවාගැනීමට කොන්ත්‍රාත් පදනම භාවිත කොට ඇත. විශ්වවිද්‍යාල පද්ධතිය තුල සුවිශේෂී ක්‍රියාකාරීත්වයකින් ආයතනය පවත්වාගෙන යාමට කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් කාර්ය මණ්ඩලයේ දායකත්වය ඉමහත් පිටිවහලක් වී ඇත. විශ්වවිද්‍යාල පද්ධතියේ පවතින වැඩ වර්ජන වැනි වෘත්තීය සමිති ක්‍රියාමාර්ග වලින් ආයතනයේ කටයුතු වලට කිසිදු බාධාවක් මෙතෙක් සිදුව නොමැති අතර එම වාසිදායක තත්ත්වයට බෙහෙවින් ඉවහල් වන සාධකයක් වනුයේ ද කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලබන කාර්ය මණ්ඩලයයි.

(ඉ) සේවාදායකයින්ට සහන සැලැසීමට හෝ ඔවුන්ගේ සුවපහසුව සඳහා සේව්‍යයා විසින් ලබාදෙන සියලු පහසුකම් හා ප්‍රතිලාභ සේවක සුබසාධනයට අයත් වේ. එබැවින් අදාළ සියලු වියදම් සුබසාධක විෂය පථයට අයත් වන බව ආයතනයේ මතය වේ. සුභසාධන විෂය පථයට අයත් වන මෙම ප්‍රතිලාභ දිගුකාලීනව කාර්යමණ්ඩල සාමාජිකයන් විසින් භුක්ති විඳින ඒවා බවද මෙහිදී සළකා බැලිය යුතු වේ.

(ඊ) කොවිඩ් 19 නිසා භෞතික දේශන නොපැවැත්වෙන බැවින් ආයතනය වෙත ශිෂ්‍යයින් පැමිණීම සිදු නොවේ. මේ නිසා ආපන ශාලාව අලාභ ලබන අතර එහි හිමිකරුවන් පවසනුයේ එම තත්ත්වය මත ආපන ශාලාව වසා දැමීමට සිදුවන බවයි. ආපන ශාලාව ක්‍රියාත්මක නොවීමෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මෙන්ම ආයතනයේ පරිපාලන කටයුතු වලට මතුවන දුෂ්කරතා මඟහරවා ගැනීමට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත මෙම ගෙවීම සිදුකරනු ලැබේ.